
# දෙමංසල





මනෝ ෆොන්සේකා

කරුණාකර බුද්ධිමය අයිතීන්ට
ගරු කරන්න

මගේ අනිකුත් කෘතීන්....

- නොසැලෙන සෙනෙහස (නව කතාව)
- ගාඩීනියා මල (කෙටි කතාව)
- ලුණු රසැති තේ (කෙටි කතාව) - *අනුවාදය*

# දෙමංසල

## (ඒ සමාජ යථාර්තයයි)





මනෝ ෆොන්සේකා

2013



# පෙර වදන

ආත්මාර්ථකාමිත්වය හා ආත්ම සාධනය සෑම මිනිසෙකුටම ආවේණික ලක්ෂණයකි. මෙම ගතිය සීමාව ඉක්මවා ගියහොත් ඉන් සමාජයට බලවත් හානිදායක වාතාවරණයක් ඇති වේ. රටක, සමාජයක නීති රීති පද්ධතියක් සහ සාරධර්ම සමූහයක් සනිටුහන් කොට තිබෙන්නේ මේ අනිසි ප්‍රතිඵල වලින් සමාජය පිරිහීම වැළැක්වීමටය.

අද රටේ දක්නට තිබෙන්නේ දැඩි පන්ති අරගලයකි. මෙහිදී ප්‍රධාන වශයෙන් පන්ති කොටස් තුනක් හුවා දැක්විය හැකිය. උඩින්ම ඇත්තේ ප්‍රභූ පන්තියයි. දෙවනුව ඇත්තේ මේ ප්‍රභූ පන්තියට උඩ ගෙඩි දෙන හෙංචයියන්ගේ පන්තියයි. මේ පන්ති දෙකටම යටවී තැලී පොඩිවී ඇති තුන්වන පන්තිය වන්නේ මහ පොළොවේ පය ගසා ජීවත් වන රටේ බහුතර ජනතාවයි. මහජනයා නිරතුරුවම උඩ පන්ති දෙකට ආදේශ වීමට හා එහි රැඳී සිටීමට දරණ ප්‍රයත්නය නිසා අද විශාල සමාජ පරිහානියක් හා නීතිය වල් වැදීමක් දක්නට ලැබී ඇත.

මුදල් යහමින් ඇති කෙනෙකුගේ තරාතිරම කුමක් වුවත්, උගත් කම කුමක් වූවත්, හැදියාව කුමක් වුවත්, මේ පුද්ගලයා ඉබේම උඩ පන්ති දෙකින් එකකට පිළිගැනෙනු ඇත. බලය ඇති තැනැත්තාගේ තත්වයද එසේම වේ. මේ පන්ති දෙකට අයත් පිරිසට අති විශේෂ වරප්‍රසාද ඇත. බොහෝ විට නීතිය ඔවුන්ගේ පැත්තේය. මේ නිසා ඔවුන් තම මන දොළ සහ අවශ්‍යතා විවිධ ආකරයෙන් සපුරා ගැනීමට තුන්වන පන්තියට අයත් සාමාජික සාමාජිකාවන් අනිසි ලෙස පාවිච්චි කිරීම සහ හසුරුවීම අද සමාජයේ බහුලව දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළබඩ සංචාරක ස්ථානයක් වූ ආරුගම් බොක්කේදි මා ලද අත්දැකීමක් සහ අද සමාජයේ පවතින මේ වාතාරණය ආශ්‍රයෙන් ' දෙමංසල ' කෙටි කතාව මා නිර්මාණය කලේ සමාජයේ පවතින මේ අසාධරණයෙන් බිඳක් ඔබ වෙත ගෙන ඒමටය.

' දෙමංසල ' යථාර්තවාදි  කතා වස්තුවකි. 'සහා තොමෝ සතුටින් විසිර ගියෝය' යනුවෙන් අවසානයක් මීට නැත.  'දෙමංසල ' තුලින් ඔබ අද සමාජය ගැන යම් අවබෝධයක් ලබා ගත්තේ නම්, සමාජයේ ජීවත් වන අහිංසක බහුතර ජනතාව දෙස උපේක්ෂාවෙන් බලන්නට අදහසක් ඇති වූයේ නම්  ' දෙමංසල ' නිර්මාණය කිරීම තුලින් මා ගත් උත්සාහය යම් තරමක් හෝ සාර්ථක වී ඇත.

*මනෝ ෆොන්සේකා*

*2013*



# පිළිගැන්වීම

සමාජ සාධාරණයක් ඇති කිරීමට සිතින්, කයින් සහ වචනයෙන් සුළුවෙන් හෝ මෙහෙවරක් ඉටු කිරීමට උත්සාහ දරණ සියලූ දෙනාටම මම 'දෙමංසල' ගෞරවයෙන් පිළිගන්වමි..

මෙම කථා වස්තුවේ අන්තර්ගතයේ ස්වභාවය අනුව මෙය වයස අවුරුදු දහසයට අඩු අයට කියවීමට සුදුසු නැත.

මනසට කාන්තියත්, ගතට සිසිලත් ගෙන දෙන ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශයේ සුන්දරත්වයෙන් ප්‍රමෝදයට පත් නොවන කෙනෙකු වේ එය අරුම පුදුමයකි. මනරම් කඳු වැටි, තේ වතු, දියඇලි වලින් පිරිපුන් මේ ආශ්චර්යමත් ප්‍රදේශයේ සුන්දරත්වය නිසා ජීවිතයේ සියළු ගැහැට අමතක වී ශාන්ත ශිථිලත්වයක් ගතට සහ සිතට ගෙනදේ.

විදේශීය සංචාරකයින් පවසන අන්දමට ශ්‍රී ලංකාවේ කඳුකරය අලංකාරය අතින් දෙවැනි වන්නෙ ස්විට්සර්ලන්තයට හා නවසීලන්තයට පමණි.

*'උඩරට කඳුකරයේ...*
*බැසයන සුන්දරියේ...*
*සුකොමල දුන්හිඳ සුරතලියේ...*
*ඔබ හෙළයට සිරිය ගෙනේ.....'*

මනමාලියකගේ වේල් පටයක් සේ කඩා හැලෙන දුන්හිඳ දිය ඇල්ල ගීතයකින් වර්ණනා කර ඇත්තේ මෙසේය.

උඩරට බෑවුම් වල ඇති තේ වතු සහ එම වතුවල තේ දළු නෙළන සුන්දර යුවතියන් පරිසරයේ සුන්දරත්වය දෙගුණ තෙගුණ කරයි.

*'උඩරට කඳුකර.. සිරියා පරදන....*
*රුබර මුහුණ ඔබේ......*
*රතැඹිලි දිගු කොට මදහස නංවන...*
*තේ දළු නෙළන ළඳේ......'*

තේ දළු නෙළමින් තම ජීවිකාව ගෙන යන, ලංකාවේ ආර්ථිකයට පණ පොවන ඒ රුබර යුවතිය ලාංකික අභිමානයේ සංකේතයකි.

ස්වභාව ධර්මයෙන් දායද කළ මේ රමණීය පරිසරයේ ජීවත් වන පුද්ගලයින් එයට දැක්විය යුතු ගරුත්වය නිසි පරිදි ලබා දෙනවාද? නැත, එය එසේ සිදුවන්නේ නැත. මේ මනරම් පරිසරයට පමණක් නොව මූලික මිනිස් ධර්මයන්ට පවා කිසිම තැකීමක් නොකරමින් තම ආත්මාර්ථය උදෙසා කරයුතු කිරිමට අද ජන සමාජය පෙළඹී ඇත. රට කරවන ඇත්තන් මෙන්ම, ප්‍රදේශ භාරව සිටන ඇත්තන් ද මේ ආත්මාර්ථය ජන සමාජය තුලට තවත් කිඳා බැසයන ආකාරයට කටයුතු කිරීම කෙතරම් අභාග්‍යක්ද?

මේ කඳුකරයේ එක්තරා පළාතක් පාලනය කිරීමට පිහිටුවා ඇති සභාවක මූලස්ථාන කාර්යාලය තිබෙන්නේ චමත්කාර ජනක දර්ශනයකින් යුතු කඳු බෑවුමකය. මෙහි ප්‍රධානියා ඇතුලු අන් සියළුම බලධාරීන් මහජන ඡන්දයෙන් තේරී පත්වූ පුද්ගලයින්ය. ඔවුන් මහජන සේවය ඉටු කිරීමට සහ මහජන දේපල ආරක්ෂා කිරීමට නීතියෙන් මෙන්ම සදාචාරයෙන්ද බැඳි තිබේ. එහෙත් එය එසේ සිදු වේද?

මහජන ඡන්දයෙන් මෙම සභාවට තේරී පත්වූ සභාපති තුමා ජිනසේන විදුරංගලය. තේරී පත් වීම සඳහා ඔහු තම ඡන්ද ව්‍යාපාරයට විශාල මුදලක් වැය කලා පමණක් නොව මැර බලයද බෙහෙවින් යෙදවිය. මේ ගැන කිසිවකු තැකීමක් නොකරේ එය අද රටේ දේශපාලන සංස්කෘතිය වී ඇති නිසාය. ඡන්ද ව්‍යාපාරය සඳහා

ඔහුට ප්‍රදේශයේ කූට ව්‍යාපාරිකයන්ගෙන් අවශ්‍ය ප්‍රතිපාදන අඩුවක් නැතිව ලැබුනි. මේ හේතුව නිසා සභාපති ලෙස පත්වූ විට ජිනසේනට මේ ව්‍යාපාරිකයන්ගේ මන දොල විවිධ ආකාරයෙන් සපුරාලීමට සිදු විය. කූට ව්‍යාපාරිකයන් ඡන්ද වැඩට මුදල් යොදවන්නේ තම අපේක්ෂකයා බලයට පත් වූ විට නොයෙකුත් ලාබ ප්‍රයෝජන සූරා ගැනීමටය.

බලයට පත්වූ විට සභාපති, අනිකුත් සභිකයන් සහ අනුබද්ධිත රජයේ කාර්යාල වල දූෂිත නිලධාරින් කල්ලියක් ගැසීම අනිවාර්යයෙන් සිදුවන දෙයකි. එතැන් පටන් සිදුවන අයථා කටයුතු වලට මේ සියල්ලන්ම සම්බන්ධ වන නිසා මෙම ක්‍රියා කිසිවක් නීතියේ රැහැනට අසු නොවේ. එසේ අසුවුවද දේශපාලන බලය යොදවා ඒවා යටපත් කිරීම කජු කන්නා වැනි පහසු ක්‍රියාවකි.

"අයිසෙ සමන්.. මේ පළාතෙ පාරවල් හදන්න ග්‍රාන්ට් එකක් ලැබන්නෙ යනවා කියල ආරංචියක් ආවා... සැහෙන ලොකු ගාණක් මට හිතෙන විදියට...."

ජිනසේන දිනක් තම සභිකයෙකු වූ සමන්ට කීවේය. මනාප ඡන්දයෙන් තුන්වන ස්ථානයට පැමිණි සමන් අන්ත දූෂිත ලෙස දේශපාලන කටයුතු කරන පුද්ගලයෙකි.

"කොහෙන්ද ජිනේ ඔය ග්‍රාන්ට් එක හම්බ වෙන්නෙ?......" සමන් ඇසුවේය.

"මම හිතන්නෙ ඒෂියන් බැන්ක් එකෙන් ලෝන් එකක්... කොහෙන් ආවම අපිට මොකද බන්... අපිට තියෙන්නෙ කුට්ටිය කඩා ගන්න එක විතරයි... හි.හි.හි...."

"ඒක හරි බන්.... ඡන්දෙට වියදම් කරල මේකට ආවේ අත ලෙව කන්න නෙමෙයිනෙ.. මේ එහෙනම් පියරත්නයට කියන්න ඕන හොඳට ගාණ වැඩි කරල එස්ටිමේට් එක හදන්න කියලා... "

පියරත්න යනු මොවුන්ගේ හැම දූෂිත ව්‍යාපාරයකටම ඉත සිතින් සහය දෙන විෂය භාර කාර්යාලයේ සිටින 'රජයේ' සේවකයෙකි.

"ඔව් ඔව්.. මිනිහා නියමෙට වැඩේ දෙයි... ඕවට මිනිහ සූරයා... දැක්කනෙ අර පාළම් ප්‍රොජෙක්ට් එක කරපු විදිය... නියම ගාණක් නෙ ඒකෙන් අපිට ආවෙ... හි.හි.හි.." ජිනසේන ලොකු වීර ක්‍රියාවක් කල ආකාරයෙන් කීවේය.

"ජිනේ.. අපිට කොච්චර කුට්ටියක් දානවද... 10% නේ ඉස්සර දැම්මෙ....."

"මේ ඕයි... 10% න් දැන් අත ලෙව කන්නද අයිසේ... අද කාලේ වේසියොත් ගාණ උස්සල තියෙන්නෙ... උනුත් එහෙම කරනවනම් අපි වගේ ලොකු මහජන සේවයක් කරන අය කොච්චර දාන්න ඕනද... අපිට 40% ක් දානවා... මතක ඇතුව පියරත්නයගේ ගාණත් එකතු කරනවා..... ආර්ථික උද්ධමනය ගැන තමුසෙ අහල නැද්ද...."

"ඔව් ඉතින්.. ජිනේ හොඳට දන්නව ඇතිනෙ වේසියො ගණන් උස්සන ඒවා...හි.හි.හි... හරි හරි... මම එහෙම කරන්න කියල මැන්ට කියන්නම්... එතකොට කාටද කන්ට්‍රැක්ට් එක දෙන්න හිතා ගෙන ඉන්නෙ?....."

"මේ පාර කොහොම හරි මාටින් මුදලාලිට එන විදියට සෙට් කරන්න ඕන... මිනිහ අපිට සැහෙන්න වියදම් කරානේ... තවත් එකක්.. දැන් මිනිහ සැහෙන්න ලොක්කට කිට්ටුයි... ඉතින් ඒ පැත්තෙනුත් ඕන වුනොත් වැඩක් කර ගන්න පුලුවන් වෙයි...."

"රායිට් ජිනේ... මම වැඩේ නියමෙට දෙන්නම්......"

මහජන ඡන්දයෙන් තේරී පත්ව, මහජන මුදලින් යැපෙමින් මෙසේ මහජන මුදල් සූරාකන අමන දේශපාලකයින් නිසා අද

සමාජය යටිකුරු වී ඇත. මේ නරක ආදර්ශය සමාජයේ සෑම පැතිකඩකටම පිළිකාවක් මෙන් පැතිර යෑම නිසා මෙවැනි දූෂිත ක්‍රියා සාමාන්‍ය කටයුතු ලෙස සැළකීමට ජනතාව පුරුදු වී ඇත.

සිය දහඩිය මහන්සියෙන් ශ්‍රමය හෝ මොළය වෙහසා වැඩ කොට ජීවිතය ගැට ගසා ගැනීමට දුෂ්කර ප්‍රයත්නයක යෙදී සිටින අවංක මිනිසුන් ගැන කිසිවෙකු වැඩි තැකීමක් කරන්නේ නැත. එය ඔවුන්ගේ 'කරුමය' යැයි හංවඩු ගැසීමට පෙළඹී ඇත. මේ 'කරුමය' ඇති කරන්නේ කවුද කියා විමර්ශනය කිරීමට හෝ එයට පිළියමක් යෙදීමට කිසිවකු උත්සාහයක් හෝ උනන්දුවක් නොගනී.

++++++++

ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළබඩ තීරයේ පිහිටි ආරුගම් බොක්ක නිවාඩු නිකේතනයක් ලෙස බොහෝ කලක සිටම ප්‍රසිද්ධියක් උසුලයි. ආරුගම් බොක්ක ලෝක වාසි මුහුදු රළ ක්‍රීඩකයන් අතර ජනප්‍රිය ස්ථානයකි. මේ නිසා ලෝක මුහුදු රළ තරඟාවලියක් පවා ආරුගම් බොක්කේ පවත්වා ඇත.

පසුගිය යුද්ධ සමයේදී ත්‍රස්තවාදි ප්‍රහාරයන්ගෙන්ද, 2004 සුනාමි රළ පහරින්ද මහත් පීඩාවකට ලක් වූවත් ආරුගම් බොක්කේ සුන්දරත්වය  අඩු වී නොමැත. එයට හේතුන් වූයේ ප්‍රදේශයේ ඇති ස්වාභාවික සුන්දරත්වයත්, එහි වාසය කරන සාමාන්‍ය ජනයාගේ සරල දිවි පැවැත්මත් ය. සංචාරක ස්ථානයක් වූවත් ආරුගම් බොක්කේ අහස උසට ගොඩනැගිලි තවමත් නොමැත. මුහුදු වෙරළ ආශ්‍රිත ස්වාභාවික සෞන්දර්යය හා මුසු වන ආකාරයට තැනුන නවාතැන් වලින් සමන්විත ආරුගම් බොක්ක නිස්කලංක නිවාඩුවක් ගත කිරීමට කැමැත්තක් ඇතියවුන්ට අනගි ස්ථානයකි.

ආරුගම් බොක්කෙ වාසය කරන ජනයාගෙන් වැඩි කොටස මුස්ලිම් හා දෙමළ ජාතිකයන් වේ. ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ ධීවර කර්මාන්තයයි. මීට අමතරව සංචාරක ව්‍යාපාරය නිසා

ජීවිකාව සරි කරගන්නා පිරිසක්ද ආරුගම් බොක්ක, උල්ල හා පොතුවිල් වල සිටිති.

සරීනා සහ මුසාමිල් ආරුගම් බොක්කේ උල්ල ගම්මානයේ වාසය කරන, ධීවර කර්මාන්තය රැකියාව කොට ගත් යුවලකි. මුසාමිල් ගේ වයස අවුරුදු තිස් පහක් වන අතර සරීනා විසිහය වියැති තරුණියකි. දරුවන් දෙදෙනකුගේ මවක වන සරීනා ගේ තරුණ ලාවණ්‍යය දරු උපත් නිසා මදක් අඩු වූවත් ඇය තවමත් පියකරු තරුණියකි.

ආරුගම් බොක්ක සහ පොතුවිල්-පානම මාර්ගය අතර ඇති වෙරළ තීරයේ තනාගත් කුඩා පොල් අතු පැලක වෙසෙන මුසාමිල් සහ සරීනා අධික දිළිඳු කමෙන් පීඩාවට පත් වූවත් ආදරය හා අන්‍යෝන්‍ය අවබෝධය අතින් දෙදෙනා ඉතා පොහොසත් වූහ. සමහර අඹු සැමියන් මෙන් මූණ ඉච්ඡාවට නොව හදවත පතුලෙන්ම දෙදෙනා එකිනෙකාට ආදරය කලා.

ජීවිතය ගැට ගසා ගන්නට මුසාමිල් සහ සරීනා ඉතා දුෂ්කර වෑයමක යෙදෙති. දිනපතාම සන්ධ්‍යා කාලයේ මහ සාගරයේ දියඹට තම සගයා සමග ඔරුව දියත් කරන මුසාමිල් තම පවුල රක්ෂා කිරීමට මහ මුහුදේ සිටින මත්ස්‍යයින්ගේ සහාය පතයි. මෝටර් බෝට්ටුවක් කොටස් වශයෙන් ගෙවිමට හෝ හැකියාවක් නොමැති මුසාමිල් තමාගේත් තම සගයාගේත් බාහු බලය සහ හබල ගැන පූර්ණ විශ්වාසය තබා යන මුහුදු ගමන කෙතරම් අන්තරාදායකද? දැඩි රළ පහරත්, මුහුදු කුණාටුත් අතරින් ඔහු මේ ගමන යන්නේ සඳලු තල වල වෙසෙන මිනිසුන් මෙන් විනෝදයට නොවේ. ඔහු මේ ව්‍යායාමය කරන්නේ ජීවත් විමටය. බඩ වියත රැක ගැනීමටය.

*'ගණ අඳුරේ... රළ අතරේ.....*
*ජීවය පරදුවට තබා......*
*වියත රකින මහ සම්පත් නෙලා ගන්න මුහුදු ගියා.....'*

අද සමාජයේ ජීවත් වන මිනිසුන් මෙන් මුහුදේ සිටින මසුන්ද ඉතා සුළු දෙයකට වැඩ වර්ජනය කලහොත් මුසාමිල්ගේ පවුලට වන්නේ මහ විපත්තියකි.

*'තෝරු මෝරු පොකිරිස්සෝ....*
*අපෙ දුක සැප විමසනවා.....*
*තොරතුරු ගැන කම්පා වී අපේ දැළට ළං වෙනවා... අපේ දැළට ළං වෙනවා....'*

තෝරු මෝරු පොකිරිස්සන් තුල ඇති මේ අනුකම්පාව අද මිනිසුන් තුල නොමැත.

මුසාමිල්ගේ මේ ජීවිත සටනට සරීනා ආදරණීය බිරිඳකගෙන් ලැබිය යුතු පූර්ණ සහාය ලබා දුන්නාය. වයස අවුරුදු පහක් වූ ගැහැණු දරුවාත්, අවුරුදු තුනක් වයසැති සිඟිති පිරිමි දරුවාත් රැක බලා ගැනිම පමණක් නොව ගෙදර දොරේ සියළුම වැඩ කටයුතු ඇය තනිවම කිසිම මැසිවිල්ලක් නොමැතිව සිදු කරන්නීය. උදෑසන අවදි වුන මොහොතේ සිට රාත්‍රියේ නින්දට යන තුරුම ඇය කිසිම අස්වැසිල්ලක් නොමැතිව තම වැඩ කටයුතු වල යෙදෙන ආකාරය අද නගරයේ ජීවත් වෙමින් සුළු දෙයකට වුවද මැසිවිලි නගන යුවතියන්ට මහඟු ආදර්ශයකි. ඇයට නවීන පන්නයේ ගෘහ උපකරණවත්, ජංගම දුරකථනවත් නොමැත. ඇය සෑම කටයුත්තක්ම සිය දෑතේ සවියෙන් හා වීරියෙන් කල යුතුව තිබේ.

සරීනාගේ රූප සම්පත්තියට වසඟ වී ඇගේ සිරුරට ආසා කොට මුදලට ඇය සමග අයථා ක්‍රියා වලට ඇරයුම් කල දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ ගණන නිමක් නැත. කිසිම සාර ධර්මයක් නොසළකන ගැහැණුන් මෙවැනි ඇරයුමක් ලද පමණින් පිරිමින්

සමග යහන් ගත වන්නේ අන් සියලු දෙයකටම වඩා මුදල අගය කරන නිසාය. එහෙත් කෙතරම් දරිද්‍රතාවයකින් පෙළුනත්, බඩට කන්නට අහරක් නොතිබුනත්, ඒ සියළු දුක් ගැහැට වලට වඩා සරීනා තම ආත්ම ගරුත්වය, පති භක්තිය හා සිය පවුලේ ගරුත්වය අගය කලාය. සිය පවුල වෙනුවෙන් විඳින දුක් ගැහැට ඇයට බරක් නොව ආභරණයක් විය.

රාත්‍රියේ මුහුදු ගිය මුසාමිල් පසුදා උදෑසන ආපසු එනතුරු සරීනා බලා සිටින්නේ බලවත් නොඉවසිල්ලෙන්ය. මහ සාගරයේ රුදුරු බව සරීනා හොඳ හැටි දනී. මේ නිසා කාළගුණය අයහපත් රාත්‍රී කාල වලදී ඇයට හරි හැටි නින්ද නොයයි. මෙසේ ඇතිවන දුක සහ බිය ඇය තුනී කර ගන්නේ සිය දරු දෙදෙනා තුරුලු කර ගැනීමෙනි.

මුසාමිල්ගේ දැළට අසුවන මසුන් අඩු වූ විට එය පවුලේ සුළු ආදායමට පවා තදබල පහරක් එල්ල කරයි. මෙවැනි දිනවලදී පවුලේ බඩ ගින්න නිවීම පවා බෙහෙවින් දුෂ්කර කාර්යයක් වේ. මේ අසීරු අවස්ථාවලදී සරීනා සෙනෙහෙබර මවක හා ආදරණීය බිරිඳක වශයෙන් තම කැප කිරීම සිදු කරන්නෙ එය සැපතක් ලෙස සිතා ගෙනය. මුසාමිල් උදෑසන නිවහනට එන විට කෙසේ හෝ ඔහුගේ උදය ආහාරය සරීනා පිළියෙල කර තබනවා. එය බොහෝ විට රොටියකට, ලුණු මිරිසකට හෝ මාළු ව්‍යංජනයකට සීමා වෙන ආහාරයකි.

"සරීනා.. ඔයයි ළමයි දෙන්නයි කෑවද?......" මෙය මුසාමිල් උදේ ආහාර ගැනීමට පෙර සෑමදාම අසන ප්‍රශ්නයකි.

"ළමයි දෙන්න කෑවා... මම පස්සෙ කන්නම්...."

සරීනා දෙන පිළිතුර මෙයයි. එහෙත් සරීනාට කෑමට තරම් දෙයක් නැති බව මුසාමිල්ට වැටහෙන වාර ගනන අනන්තය. මෙවිට ඔහුගේ හදවත වෙඩරු පිඩක් මෙන් උණුවේ. තම ප්‍රියාදරියට

ඇති බලවත් ආදරය දෙගුණ තෙගුණ වී ඔහුට දැනෙන්නට පටන් ගනී. දිළිඳු බවේ පතුලටම ගිලා බැස තිබුනත් සරීනා වැනි ළඳක් ලබන්නට තමා කොතරම් වාසනාවන්තදැයි මුසාමිල්ට තේරුම් යයි.

"එන්න සරීනා... මේක අපි දෙන්නම බෙදා ගෙන කමු...."

"අනේ නෑ ඔයා කන්න... රෑ එළි වෙනකන් ඔරුව පැදල ඔයාට කොච්චර මහන්සිද?...."

"මොකෝ... ඔයා නිකන්ද ඉන්නෙ?... ඔයත් කොච්චර වැඩ කරනවද... මෙන්න මෙහාට එන්න ළමයො......."

සරීනාව ආදරයෙන් තුරුලු කර ගන්නා මුසාමිල් රොටිය දෙකට කඩා ඉන් කෑල්ලක් සරීනාට කවන්නේ කිව නොහැකි තරම් ආදරයකින්ය. ජනිත වූ ස්වාමි භක්තිය නිසා මෙවිට සරීනාගෙ ඇස්වලින් නිතැනින්ම කඳුලු ගලන්නට පටන් ගනී.

දිළිඳු බවේ අඳුරේ ගිලී සිටියත් සරීනා අද සමාජය තුල සොයා ගැනීමට අපහසු උදාර කාන්තාවකි. ආදර්ශමත් මිනිස් දුවකි. ඇය මවකගේ ගීතයයි. අඹු සැමි බැඳීමේ පතිනියයි.

++++++++

ජිනසේන විදුරංගල සිය මොන්ටෙරෝ රථයෙන් කාර්යාලය බලා පැමිණියේය. තීරු බදු රහිත බලපත්‍රයකින් ලබා ගත්තද මෙම මෝටර් රථය රුපියල් මිලියන ගණනාවක් වටිනා රථයකි. සභාපති ලෙස ඔහුට ලැබෙන වැටුපෙන් මෙවැනි වාහනයක් මිලදී ගත්තේ කෙසේද යන්න විමසා බැලීමට කිසිවෙකු උනන්දුවක් ගන්නේ නැත.

"අයිසෙ සමන්.. අද ඇමති තුමා එක්ක මීටින් එක නියමෙට ගියා... අපිට ඕන සල්ලි ඔක්කොම පාස් වුනා.. හි.හි.හි... දැන් තියෙන්නෙ ඉතින් අපේ වැඩ කොටස තමයි..."

ජිනසේන තම අතිජාත සගයා වූ සමන් අමතා කිව්වේය.

"අම්මපා...නියමයිනෙ ජිනේ... මේ... එහෙනම් අද හවස දාමු පොඩි ජොලියක්... හරිද?..... හි.හි.හි...."

"හරි හරි.. මම ක්ලබ් එකේ වැඩේ සෙට් කරල ආවෙ අද හවසට....."

"ෂා මරු... මේ.. බඩු කෑලි ටිකකුත් ඉන්නව නෙ...හි.හි.හි..."

"යකෝ උන් නැතුව පුලුවන්ද... මම අලුත්ම සෙට් එකක් ගේන්න කිව්වා...."

"නියමයි... දාමු මරු ආතල් එකක්....."

මේ දෙබස නැවතුනේ ජිනසේන ගේ පුද්ගලික ලේකම් වරිය වූ ඉමේශා එතැනට පැමිණීම නිසාය.

"ඇයි ඉමේශා?....." ජිනසේන ඇහි බැම කරකවා ඇසීය.

"සර්.. කවුද ගෑණු ළමයෙක් එයාගෙ ස්වයං රැකියා ලෝන් එක ගැන අහන්න ඇවිල්ලා ඉන්නවා......"

"මේ ළමයො... මම නෙමෙයි නෙ ලෝන් පාස් කරන්නෙ.. ගිහිල්ල ෆිනෑන්ස් සෙක්ෂන් එකෙන් අහන්න කියන්න....." ජිනසේන නුරුස්නා ගතියකින් කීය.

"මන් දන්නෙ නෑ සර්... මෙයා ෆිනෑන්ස් එකට ගිහිල්ලා වැඩේ කෙරුන නැති හින්දා සර්ව මීට් වෙන්න ඕන කියනවා....."

"කෙල්ල ලස්සනද?....."

"මම දන්නෙ නෑ....." ඉමේශා අහක බලාගෙන තරහෙන් කීවාය.

"ආ හරි හරි කෙල්ලේ... ඕකට ඔච්චර තරහ ගන්න ඕන නෑ... එහෙනම් එන්න කියන්නකො.. මොකද්ද දුක් ගැනවිල්ල කියල බලන්න.. ඔන්න බලන්න සමන්.. අපි කොච්චර මහජන සේවයක් කරනවද කියල... මිනිස්සු හිතාගෙන ඉන්නෙ අපි නිකන් ඉන්නව කියල... අපිට අයිති නැති වැඩත් අපි කරනවා...."

"ඔව්.. අයිති නැති වැඩ නම් කරනව තමයි....." සෙමින් තමාට කියාගත් ඉමේශා එළියට ගියාය.

"ජිනේ.. ඉමේශගෙ පස්ස ගැස්සෙන කොට පිස්සු හැදෙනව නේද?.... උඹ නම් ඉතින් හොඳට සැප ගන්නවනෙ ඒකිගෙන්..."

"ඉතින් බන් මෙච්චර මහජනතාවට සේවයක් කරන අපි ඔය පොඩි සැපක් ගත්තම මොකද?... ඒකිටත් සැප නෙ ඉතින්....."

කන්නට උවමනාවූ විට ගොරකත් දඩමස් කර ගැනීම සාමාන්‍ය සිරිතය.

මද වේලාවකට පසු ඩෙනිම් කළිසමකින් සහ සුදු පාට විලාසිතා කමිසයකින් සැරසුන ගැහැණු ළමයෙකු ජිනසේන ගේ කාර්යාලයට පැමිණියාය. ඇගේ පියකරු පෙනුමෙන් සමන් සහ ජිනසේන දෙදෙනාම යම්කිසි තිගැස්මකට ලක් විය. කෙසේ හෝ තම සන්සුන් බව රැක ගත් ජිනසේන දේශපාලන රස්නය විහිදුවන්න පටන් ගත්තේය.

"ඔව්... මොකද්ද මේ ළමයගෙ ප්‍රශ්නෙ?......" පුටුවේ වටයක් කැරකුන ජිනසේන ඇසීය.

"සර්.. මම දැන් දවස් ගානක් ආවා මගේ ලෝන් එක පාස් කර ගන්න.... ඒත් තවම හරි ගියේ නෑ... එක එක දේවල් කියනව හැමදාම..ඒත් වැඩේ කෙරෙන පාටක් නෑ... ඒක හින්ද මම කෙළින්ම සර්ට කියන්න ආවා...." ඇය එක එල්ලේ පැවසුවාය.

ඇගේ කතා විලාශය නිසා ජිනසේනට ඇය ගැන අමුතු ලැදි කමක් ඇති විය. නොවළහා කතා කරන ගැහැණුන් බොහෝ පිරිමින්ගේ සිත් ඇද ගැනීමට සමත් වේ.

"මේ ළමයගෙ නම මොකද්ද?......"

"නිලූකා......"

දුරකථනය අතට ගත් ජිනසේන ගිණුම් අංශය ඇමතීය.

"මගේ ඔෆිස් එකට නිලූකා කියල කෙනෙක් ඇවිත් ඉන්නව එයාගේ ලෝන් එකක් ගැන අහන්න.. මොකද්ද ඒකෙ තත්වෙ?......"

"අනේ සර්... ඔයාගෙ ඇපේට අත්සන් කරපු එක්කෙනාගෙ ආදයම් වාර්තා ඔක්කොම බොරු.. ඉතින් අපි ඇප්ලිකේෂන් එක රිජෙක්ට් කරා... මෙයාට ලෝන් එක ගෙවා ගන්න බැරි වුනොත් අපි ඔක්කොම අමාරුවෙ...." විෂය භාර නිලධාරියා කීය.

"හ්ම් එහෙමද...." ජිනසේන දුරකථනය විසන්ධි කළේය.

"මේ නිලූකා... ඔයාගේ ෂුවරිටි අත්සන් කරපු එක්කෙනාගේ ආදායම් වාර්තා වැරදි ඒවා නේද?...."

ජිනසේන තදින් ඇසීය. නිලූකාගේ මුහුණ කළු ගැසිනි.

"න්න්.. එ..එහෙම නෑ සර්... ඒව හරි..ඒත් ඔෆිස් කට්ටිය එක එක ඒවා කියනවා...."

නිලූකා තරමක් ගොත ගසමින් කීවත්, කාමුක සිනාවකින් ජිනසේන මන්මත් කිරීමට සමත් විය.

"ම්ම්.. හරි අපි හොයල බලලා කියන්නම් කො... එහෙනම් දැන් ඔය ළමයා යන්න..."

නිලූකා දොරටුවෙන් පිටව යන තෙක්ම ජිනසේන ඇය දෙස බලා සිටියේය.

"ජිනේ.. නිලූකගෙ පස්ස ඉමේෂාටත් වඩා නියමයි නේද... අම්මෝ.. දැක්කම පිස්සු ඩබල් වෙනවා.... මේ.. දැන් නිලූකගෙ ලෝන් එක හදල දෙනවද... හි.හි.හි...." සමන් ඇසීය.

"හුම් හුම් බලමුකෝ... ඕක ඉතින් පොඩි ලෝන් එකක් නෙ.... නේද සමනො....."

"ඔව් ඔව්... පොඩි ලෝන් එකට ලොකු පස්සක්... මරුනෙ...හි.හි.හි...."

දේශපාලන බලය අයුතු ලෙස පාවිච්චි වන ප්‍රධාන කාරණා දෙකක් වේ. එකක් නිතී විරෝධී ලෙස ධනය උපයා ගැනීමය. අනික තරුණියන් සහ ගැහැණුන් අපයෝජනයෙන් කම් සැප ලබා ගැනීමය. තත්ත්වය මෙසේ පවතින තාක් කල් අසාධාරණයෙන් සහ දූෂණයෙන් සමාජය විකෘති වී පවතී.

++++++++

ජීවන බරින් මිරිකී සිටින සරීනා සහ මුසාමිල්ට ජීවත් වීමට ගෙන යන සටන දිනෙන් දින දරුණු වූවා මිස හොඳ අතට හැරුනේ නැත. ජීවන වියදම වැඩිවෙන වේගයට සරිලන පරිදි ඔවුන්ගේ ආදායම වැඩි නොවන නිසා මේ තත්ත්වය ඇති වී ඇත. සිය කුඩා දියණිය පාසල් යන වයසට පැමිණ ඇති නිසා ඔවුන්ගේ පවුලේ වියදම තවත් ඉහල යනු ඇත. කෙසේ වෙතත් මේ සියළු කම්කටොලු මධ්‍යයේ සරීනාගේ ධෛර්යය සහ විඳ දරා ගැනීමේ ශක්තිය තවත් වැඩි විය. ඇය සිය ආදායම වැඩි කර ගැනීමේ මාර්ග ගැන නිතරම කල්පනා කළාය.

"මුසාමි... අපිට ඉස්සරහට වියදම් තව වැඩි වෙනව... ඔයාගේ මුහුදු රස්සාවෙන් විතරක් අපිට ජීවත් වෙන්න බෑ මුසාමි.. ඒක හින්ද

මමත් දෙයක් කරන්න හිතුවා..." දිනක් සරීනා මුසාමිල් සමග කීවාය.

"අනේ සරීනා... ඔයා කරන දේවල් මදිද කෙල්ලෙ... බලන්න ඔයා දවස තිස්සෙ කොච්චර මහන්සි වෙනවද... ළමයින්ගේ වැඩයි... ගෙදර වැඩයි... ඉතින් තවත් කොහෙද ඔයා වෙන දෙයක් කරන්නේ?...." මුසාමිල් සරීනාගෙ ඔලුව අත ගාමින් කීය.

"නෑ මුසාමි.. ඔයා හින්දයි අපේ පැටව් දෙන්න හින්දයි ඕන දුකක් විඳල වැඩ කරන්න මට හයිය තියෙනවා... ඒ හින්ද මට මේක කරන්න පුලුවන්....."

"ඉතින් ඔයා මොනවද සරීනා කරන්න හිතාගෙන ඉන්නෙ?...."

"ෆසානා ගෙ පුතා නිතරම සියඹලාණ්ඩුවට හයර් යනවා... ඉතින් මම හිතුවා සියඹලාණ්ඩුවෙන් පළතුරු ටිකක් ගෙන්න ගෙන මෙහෙදි විකුණන්න... ෆසානා කිව්වා පුතා ඒවා අරන් එන්න සල්ලි ගන්න එකක් නෑ කියල... ඉතින් ගමන් කුලියත් නැහැ නෙ....."

"හ්ම්... අනේ මන් දන්නෙ නෑ සරීනා... මගේ හිතට හරි නෑ ඔයාගෙන් හම්බ කරගන්න....." මුසාමිල් දුකෙන් පැවසීය.

"මුසාමි... අපි දෙන්නම හම්බ කරන්නෙ අපේ පවුලට... ඉතින් අපි දෙන්නම එකට එකතු වෙලා වැඩ කරාම මොකෝ වෙන්නෙ...."

සරීනා කෙරෙහි ඇති අසීමිත ආදරයෙන් සංවේදී වූ මුසාමිල් ඇය තුරුලු කරගෙන හිස සිඹබේය. ඔහුගේ දෑසින් සතුටු කඳුලු වැගිරිනි.

සරීනා සහ මුසාමිල් තරම් දරිද්‍රතාවයට පත් නොවූවත් ෆසානා සහ ඇගේ පුත්‍රයා ජීවිත සටන ගෙන යාමට විශාල වෙහෙසක් දරණ පවුලක් වේ. ෆසානාගේ පුත්‍රයා ප්‍රවාහන සේවා සමාගමක

රියැදුරෙකි. ඔහු සරීනාට අවශ්‍ය පළතුරු සියඹලණ්ඩුවෙන් නොමිලයේ ප්‍රවාහනය කර දීමට එකඟ විය.

බොහෝ විට මිනිස් කම අඳුරන්නේ ජීවිත දුක් කම්කටොලු වලට මුහුණ දුන් අයවලුන්ය. එවැනි පුද්ගලයින් නිතරම හැකි පමණින් අන් අයට උදව් උපකාර කිරීමට පසුබට වන්නේ නැත.

++++++++

අතේ වැඩි මුදලක් නොමැති සරීනාට මුලින් ගෙන්වා ගත හැකි වූයේ අඹ ගෙඩි ස්වල්පයක් සහ නාරං ස්වල්පයක් පමණය. එහෙත් ඇය එයින් පසුබට වූයේ නැත. දිළිඳු කමෙන් ගොඩ ඒමට ඇයට තිබෙන චිත්ත ධෛර්යය මේ බාධක වලින් අඩු වූයේ නැත.

එක් උදෑසනක දරු දෙදෙනා මුසාමිල් ගේ රැකවරණයේ තැබූ සරිනා කුඩා වට්ටියකට අසුරා ගත් පළතුරු රැගෙන පොතුවිල් කඩ මණ්ඩියට ගියාය. වාහනයක යාමට තරම් වත්කමක් නොතිබුන ඇය වට්ටිය හිස මත තබාගෙන අව් රශ්මියෙන් පීඩා විඳිමින් දෙපයේ වාරුවෙන් ගමන් කලාය.

වෙළඳාම කෙසේ කළ යුතුද හෝ කොහි සිට කළ යුතුද කියා කිසිම දැනුමක් තේරුමක් සරීනාට තිබුනේ නැත. ඒ ගැන උපදෙස් ගැනීමට කොහේ යා යුතුද, කාගෙන් ඇසිය යුතුද යන කාරණා ගැන අංශු මාත්‍රයක දැනිමක් ඇයට නැත.

පොතුවිල් වෙළඳ සංකීර්ණයට ආසන්න එළිමහන් ස්ථානයක සරීනා තම කුලුඳුල් වෙළඳාම ආරම්භ කලාය. කිසිම වෙළඳ මූලෝපායක් දැන නොසිටියත් ඇය හැකි අයුරින් තම කාර්යය කරගෙන යාමට සෑම උත්සාහයක්ම ගත්තාය. දැඩි හිරු කිරණ වලින් පිඩාවට පත් වූවත් ඇය ඉන් පසුබට හෝ මන්දෝත්සාහී වූයේ නැත.

එහෙත් සරීනාට වැඩි වේලාවක් තම සුළු වෙළඳාම කිරීමට නොහැකි විය. එතැනට පැමිණි නගර සභා පාලක නිලධාරියෙකුගේ හිරිහැර වලට මුහුණ දීමට ඇයට සිදු විය.

"මේ මේ.... මොනවද ඔතන කරන්නෙ ආ....." නිලධාරියා සැරෙන් ඇසීය.

"අනේ සර්.. මම මේ අඹ ටිකක් විකුණ ගන්න කියල ආවා... මගේ දරුවො බඩගින්නෙ සර්..." සරීනා පින්සෙන්ඩු විය.

"ළමයි බඩගින්නෙ කියල අපි මොනව කරන්නද?...ආ.. තියෙන වල් කමට ළමයි හදා ගත්ත නම් උන්ට කන්න දෙන්න තමුන් දැන ගන්න ඕන... මිනිහෙක් ඉන්නවද තමුසෙට...."

"ඔ..ඔව් සර්... මගේ මනුස්සය මූදු යනවා....." ඇතිවූ හිත් වේදනාව නිසා ඇසින් වැටුනු කඳුලු පිහිදන ගමන් සරීනා කිව්වාය.

"ආආආ... ඒ කියන්නෙ මිනිහා රෑට ගෙදර නැහැ නෙ..හික්..හික්.. මට හිතා ගන්න පුලුවන්.. මේ මට ඒවයින් වැඩක් නෑ... දන්නෙ නැද්ද මෙතන වෙළඳාම් කරන්න බෑ කියලා..ආ....." නිලධාරියා නැවතත් සැර විය.

"එහෙනම් සර්.. අර තව කට්ටිය එක එක දේවල් වෙළඳාම් කරන්නෙ කොහොමද?....." අසල සිටි තවත් වෙළෙන්දන් කිහිප දෙනෙකු පෙන්වා සරීනා ඇසුවාය.

"මේ... තමුසෙ මාත් එක්ක එකට එක කියන්න එනවද..ආ.... මේ ගෑණියෙ... මෙතන වෙළඳාම් කරන්න නගර සභාවෙන් විශේෂ බලපත්‍රයක් ඕන... බලනව.... අපේ නගරාධිපති තුමයි අනිත් නාගරික මන්ත්‍රී වරුනුයි නීතිය ක්‍රියාත්මක කරල මේ පැත්ත හදන්න කොච්චර මහන්සි වෙනවද කියල.... තමුසෙල වගේ ඒවුන් හින්ද තමයි කිසිම දෙයක් හරියට කරන්න බැරි... මේ රටට තියෙන හෙනේ තමයි තමුසෙල වගේ චාරයක් නැති හැතිකරයක් ඉන්න

එක.... තමුසෙල නැත්නම් අද අපේ රටත් දිව්‍ය ලෝකයක් තමයි ඕයි......"

නිලධාරියා ගෝරනාඩු කළේය. සරීනාට ලොකු දුකක් සමග සියුම් තරහක් ඇති වූවත් ඇය කිසිත් නොකියා බිම බලාගෙන සිටියාය.

"මේ.. තමුසෙ එක්ක කතා කර කර මට කාලය කන්න බෑ... ඒ හින්ද හොඳ හිතින් පව් නොදී මෙතනින් යනව යන්න....." නිලධාරියා නැවතත් කෑ ගැසීය.

ඇති වූ දුක සහ වේදනාව පපුවේ තද කරගත් අසරණ සරීනා පළතුරු වට්ටිය හිස මතට ගෙන එතැනින් ඉවත්ව යාමට සැරසුනාය. ටික දුරක් ඇය පිටුපසින් ගමන් කල නිලධාරියා ඇයට නැවත් කතා කළේය.

"මේ.. ඔහොම පොඩ්ඩක් ඉන්නවා... තමුසෙගෙ වෙළඳාම කොහොමද.. සරුද?...."

"අනේ නෑ සර්... තවම රුපියල් සීයක්වත් හම්බ වුනේ නෑ....."

"අයිසෙ.. මෙතන බඩු විකුණන්න කියාපු තැන... හොඳට කස්ටමර්ස්ලා ඉන්නවා.... මේ... තමුසෙට පුලුවන් නම් මට දවසට රුපියල් පන්සීය ගානෙ දෙන්න.. මම කොහොම හරි පර්මිට් එක අරන් දෙන්නම්..... මොකද කියන්නෙ?...." නිලධාරියා සෙමින් ඇසීය.

"අනේ සර්... මම කොහොමද එච්චර දෙන්නෙ.... මට දවසටම එච්චර හම්බ වෙයිද දන්නෙත් නෑ...." සරීනා ඇඬුම් බර හඬකින් කිව්වාය.

"හඃ.. මොකද්ද ඕයි තමුසෙගෙ ඔය වෙළඳාමෙන් ඇති වැඩේ එහෙනම්... තමුසෙට වේස කමේ ගියා නම් හොඳට හොයා ගන්න

තිබුනා... මේ පලයන් යන්න මෙතනින් මගේ දැහැට නොපෙනී.... තොපි වගේ කාළකණ්නි හින්ද තමයි අද මේ රට බල්ලට ගිහින් තියෙන්නෙ..... කිසිම වගතුවක් නෑ....."

සරීනාට ගෝරනාඩු කල නිලධාරියා එතනින් යන්න ගියේය.. සිය අසරණ කම නිසා ඇතිවූ දැඩි වේදනාවත්, දරු දුකත් පපුවේ තද කර ගත් සරීනා පළතුරු වට්ටිය හිස තබාගෙන දෑසින් වැටුනු කඳුලු පිසදමමින් ආපසු නිවෙස බලා ගමන් කළාය.

අහිංසක, නැති බැරි අය හමුවේ රටේ 'සාධාරණ' නීතිය ක්‍රියාත්මක වන්නෙ මෙලෙසය.

++++++++

"ආ...හලෝ ජිනේ... මේ දේවක කතා කරන්නෙ....."

දිනක උදෑසන ජිනසේන විදුරංගලට දුරකථන ඇමතුමක් ලැබිනි.

"කවුද?... ආ... හලෝ දේවක කොහොමද ඉතින්......"

"හොඳින් ඉන්නව මචන්... මේ...උඹෙන් පොඩි උදව්වක් ගන්න කතා කරේ....."

"ඔව් ඉතින් උඹලට අපි මතක් වෙන්නෙ උදව් ඕන වුනාම තමයි... හි.හි. .. ඉතින් කියපන්කො උදව්ව මොකද්ද කියල....." ජිනසේන ඇසීය.

"මේ.. මම දන්න කෙල්ලෙක් ඉන්නව...මේකි ඔය පැත්තෙ ප්‍රිසන් ඩිපාට්මන්ට් එකේ බ්‍රාන්ච් ඔෆිස් එකට ජොබ් එකකට දාලා තියෙනවා... උඹ ප්‍රිසන් ඒ.එස්.පී අඳුරන හින්ද පොඩ්ඩක් කියල බලපන්කො....."

"මම්ම්ම්.. කවුද ඔය කෙල්ල... උඹේ කෑල්ලක්ද... හි.හි.හි...."

"දැන් නෑ බන්... මම ඉස්සර තියාගෙන හිටිය එකක් තමයි.... මේ.. උඹට පුලුවන් දෙයක් කරපන් කො....."

"හරි හරි මචන්... මම රංජිත්ට කියන්නම්... මැන් වැඩේ කරල දෙයි...."

දුරකථනය විසංධි කල ජිනසේන සමන්ට කතා කළේය.

"මේ සමන්.. මගේ යාලුවෙක් ගෙ පොඩි වැඩක් කරල දෙන්න තියෙනවා රංජිත්ට කියල.... බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙ ජොබ් එකක්.... "

"කාටද..කෙල්ලෙක්ටද?......"

"ඔව් ඔව්... දන්නවනෙ ඉතින් රංජියගෙ හැටි... කෙල්ල හොඳ නම් ජොබ් එක ෂුවර්... හි.හි.හි...."

"ඔව්..ඔව්.. දැන් කොහොමද වැඩේ කරන්නෙ?...."

"මට මචන් මාර අයිඩියා එකක් ආවා.... අපේ සභාවෙ බස් එක තියෙනවනෙ.... අපි ඒකෙන් ට්‍රිප් එකක් ඕගනයිස් කරමු... " ජිනසේන යෝජනා කළේය.

"ආ.. ඉතින් මචන් බස් එක එහෙම පාවිච්චි කරන්න පුලුවන්ද.... UN එකෙන් පරිත්‍යාග කරේ සභාවේ වැඩ වලටනෙ.. අනික කවුරු හරි දැක්කොත් ලෙඩක් ඇදෙන්න පුලුවන්...."

"අයියෝ සමන්.. උඹ මෙච්චර පොලිටික්ස් කරනවා... උඹට ඔච්චර සිම්පල් දෙයක් තේරෙන්නෙ නැද්ද?......"

"හරි හරි.. එහෙනම් කියපන්කො බලන්න උඹේ ඔය ප්ලෑන් එක....."

"ඒක කරන්නෙ මෙහෙමයි.... අපි කියනවා මේ ප්‍රදේශයේ පාසල් ළමුන්ගේ රට පිළිබඳ දැනුම සහ හැඟීම වැඩි කරන්න

සභාවෙන් අධ්‍යාපන චාරිකාවක් සංවිධානය කරනවා කියල... එහෙම කිව්වම සියලු වියදම්.. නවාතැන් පහසු කම් සහ අනික් පහසුකම් ඔක්කොම සභාවෙ චෝට් එකෙන් ගන්න පුලුවන්... බස් එකත් ඒකට අයිතියි....."

"උඹ මේ මොන අපභ්‍රංසයක් කියනවද මට තේරෙන්නෙ නෑ... මොකද්ද ඕකෙන් අපිට වෙන වාසිය?......"

"යකෝ පොඩ්ඩක් හිටපන්කො කියන කන්.... මට ඕන අර නිලූකගෙ ලෝන් එක පාස් කරල දීල ඒකිව උස්සන්න... අනික ෂුවර් එකට රංජියටත් අර කෙල්ලව ඕන වෙනව ජොබ් එක දෙන්නනම්... ඉතින් ට්‍රිප් එක යන්නෙ මේ කෙල්ලො ටිකත් අරගෙන අපි තුන් දෙනාට යන්න... "

"ආ...දැන් උඹයි රංජියයි කෙල්ලො දෙන්න එක්ක ආතල් ගනි.. එතකොට මට උඩ බලා ගෙන ඉන්නද කියන්න..ආ බන්..."

"හරි බන්... හරි.. අපි ඉමේශවත් එක්ක යමුකො... හරිනේ... උඹ ඉතින් කොහොමත් ඉමේශට කෙළ හල හලනෙ හිටියෙ..... හි.හි.හි...."

"ම්ම්.. එහෙනම් කමක් නෑ... මේ... ඉතින් දැන් ඕකට ඉස්කෝලෙ ළමයි කොහෙන්ද එන්නෙ?....."

"ඉමේශාට කියනවා එයා දන්න ළමයි ටිකක් එක්ක එන්න කියල... හතර පස් දෙනෙක් හිටියත් ඇති... නමට විතරනෙ උන් එක්ක යන්න ඕන...."

"මේ ජිනේ... ඔය ඇට කොල්ලො කෙල්ලො එක්ක ගෙන ගිහිල්ලා පුලුවන්ද මේ වැඩ කරන්න.. බැරි වෙලාවක්වත් උන් දැකල ඇවිත් ගෙවල් වලට කිව්වොත් වැඩ දුර දිග යනවා..."

"කවුද බන් උන්ට පේන්න ඕව කරන්නෙ?... උන්ව ෂේප් එකේ පැත්තකට කරන්න පුලුවන් වෙලාව ආවම..."

"හරි..දැන් කොහාටද ට්‍රිප් එක යන්න හිතාගෙන ඉන්නෙ?....."

"අපි යමු ආරුගම් බේ වලට....."

අවාසනාවකට මෙන් බොහෝ දෙනා තම උපාය ඥානය යොදවන්නේ වැරදි දේ කිරීමටය. එය හරි මාර්ගයකට උපයෝගී කර ගත් හොත් ඉන් සමාජයට සිදුවන යහපත අති මහත්ය.

++++++++

නගර සභාවේ නිලධාරියාගෙන් ඇති වූ කෙනෙහිලි කම් නිසා සරීනාට පොතුවිල් වෙළඳ සංකීර්ණයේ සිය වෙළඳාම කිරීමට නොහැකි විය. නැති බැරි කම හමුවේ සරීනා සහ මුසාමිල් දෙදෙනාම මෙහිදි ඉතා අසරණ විය.

"අනේ සරීනා.. ඔයා එක එක්කෙනාගෙන් කතා අහන්නයි... පාච්චල් වෙන්නයි යන්න එපා... ඔයා ගෙදර වැඩයි ළමයින්ගෙ වැඩයි කරගෙන ඉන්න... මම කොහොම හරි ඔයාටයි ළමයින්ටයි කන්න අඳින්න දෙන්නම්...." මුසාමිල් සරීනාව තුරුලු කරගෙන කීවේය.

"නෑ මුසාමි... මේ ඔක්කොම වෙන්නෙ දුප්පත් අපිට තමයි.... ඒත් මම පටන් ගත්ත දේ නවත්තන්නෙ නෑ... වෙරළට ගොඩක් කට්ටිය යන්නෙ ඉස්කෝලෙ ළඟ තියෙන පාරෙන්.. ඉතින් මම එතන තියාගෙන විකුණනනවා... අඩු ගානේ දවසකට අඹ ගෙඩියක් හරි විකුණ ගන්න පුලුවන්... එහෙම කරලා මම ළමයින්ට එක රොටි කෑල්ලක් හරි කන්න දෙනවා....." සරීනා අඬමින් කීවාය.

"මගේ රත්තරන් සරීනා... ඔයාට අල්ලාගෙ පිහිට ලැබෙන්න ඕන මගෙ වස්තුව...."

මුසාමිල් සරීනාගේ කම්මුල ආදරයෙන් සිප ගත්තේ කිව නොහැකි තරම් උතුරා යන ආදරයකින්ය.

සරීනා තම උත්සාහය අත හැරියේ නැත. පානම පාරේ සංචාරකයින් බහුලව ගැවසෙන ස්ථානයක ඇය පළතුරු විකිණීම පටන් ගත්තාය.

++++++++

ජිනසේන සහ සමන් සියලු වියදම් සභාවෙන් දැරීමට සිදුවන ආකාරයට ආරුගම් බොක්කට ගමන සූදානම් කළෝය. එක්සත් ජාතින්ගේ සංවිධානයෙන් මහජන සේවය සඳහා ලබා දුන් බස් රථය, ඩීසල් වියදමද සමග ඔවුන්ගේ මේ ර්නියා සංචාරයට යොදා ගත්හ.

සභාවට මතුපිටින් පාසල් අධ්‍යාපන චාරිකාවක් ලෙස පෙන්වීමට ඉමේශා ගේ ඥාති සහ හිතවත් පවුල් වල උසස් පෙළ පාසල් ළමුන් කිහිප දෙනෙකු මේ සංචාරයට එකතු කර ගැනින. මේ ළමුන් කණ්ඩායමට ඉමේශාගේ ඥාති සොහොයුරියන් වූ ප්‍රසාදි සහ සෙව්මිනිත්, ඇගේ හිතවත් පවුල් වල ළමයින් වූ සුරංගි, රුවනි, අසංග සහ ප්‍රභාත් යන ගැහැණු පිරිමි ළමයිනුත් ඇතුලත් විය.

පිරිසේ අනිකුත් සාමාජිකයන් වූයේ නිලූකා, ඉමේශා සහ ජයනි යන තරුණියනුත්, ජිනසේන, සමන් සහ බන්ධනාගාර සහකාර අධිකාරී වරයෙකු වූ රංජිත් යන අයත්ය. ජයනි බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රැකියාවට ඉල්ලුම් කල තරුණියයි.

පිරිස ඉතා විනෝදයෙන් සහ සැහැල්ලුවෙන් ඇල්ල, වැල්ලවාය, මොණරාගල හරහා ආරුගම් බොක්ක වෙත ගමන් ආරම්භ කළෝය. ළමුන් සියල්ලම ගීත ගායනා කරමින්, සතුටු සාමීචියේ යෙදෙමින් ඉතා සතුටින් ගමනේ යෙදිනි.

තරුණියන් තිදෙනාට තමන් මේ යන ගමන ගැන හොඳ දැනීමක් තිබිනි. ඔවුන් සිය කැමැත්තෙන්ම මේ ගමන පැමිණි නිසා

ඔවුන්ට ඉන් කිසිම වකිතයක් ඇති වූයේ නැත. ජිනසේන, සමන් සහ රංජිත් තිදෙනා තරුණියන් නිසා යම් පෙළඹවීමකට පත්ව සිටියත් ළමුන් සිටින නිසා කිසිවක් කර කියා ගත නොහැකිව හැඟීම් යටපත් කරගෙන සිටියහ. විවේකයක් සඳහා බසය නැවැත්වූ විට කිසිවෙකුට නොපෙනෙන සේ තරුණියන් ස්පර්ශ කරත් ඉන් ඔබ්බට දෙයක් කිරීමට ඔවුන් පසුබට විය. කෙසේ වුවත් තරුණියන් නිසා තිදෙනාම මහත් උද්දීපනයකට පත්ව ඇති බව පැහැදිලිව පෙනෙන්නට තිබිනි.

හවස 3.00 ට පමණ පොතුවිල් නගරයට පැමිණි පිරිස අවශ්‍ය කළමනා ගැනීමට කාර්ගිල් ෆුඩ් සිටි සුපිරි වෙළඳ සලට සේන්දු විය. ජිනසේන සහ සමන්ට අවශ්‍ය වූයේ කට ගැස්මට ඕනෑ කරන දේවල් ගැනීමටය. ළමුන් සියළු දෙනාම බසයෙන් බැස සාප්පුව පුරා ඇවිදින්නට විය.

"මේ සෙව්මිනි... මට පෑඩ්ස් ඕන වේද දන්නෙ නෑ අනේ... කොයි වෙලේද කියන්න බෑ...." ප්‍රසාදි තම ඥාති සොහොයුරියට කීවාය.

"ඉතින් එහෙනම් ගන්න ප්‍රසාදි අක්කේ.. නැත්නම් මහ අවුලක් වෙනව නෙ...." සෙව්මිනි කීවාය.

"මේ සෙව්මිනි... මම හිතන්නෙ ලොකු අක්කලට නම් කොන්ඩෝම් ගන්න වෙයි... හි.හි.හි..."

"ඊ්ඊ්ඊ්ඊ්ඊ්... මොනවද ඔයා මේ කියන්නේ අක්කෙ... ඇහුනොත් එහෙම... ඒ මොකටද ඒව ගන්න ඒ ගොල්ලො?....."

"අයියෝ සෙව්මිනි... හිතා ගන්න බැරිද මේ ගොල්ලො ආවෙ මොකටද කියල... හි.හි.හි.."

ඉතා තියුණු සංවේදයක් ඇති මේ මල් වයසේ ළමුන්ගෙන් රහස් ක්‍රියා වසන් කල හැකියයි කෙනෙකු සිතන්නේ නම් එය මිථ්‍යා සිතිවිල්ලකි.

++++++++

ලබන වසරේ සිට සරීනා සහ මුසාමිල්ගේ දියණිය බාලාංශ පන්තියෙන් පාසල් සමය ආරම්භ කිරීමට නියමිතව තිබිනි. ප්‍රධාන නගරවල බොහෝ දෙනාට මෙන් ඔවුන්ට යවන පාසල ගැන ගැටලුවක් තිබුනේ නැත. උල්ල ගම්මානයේ ඇති රජයේ මුස්ලිම් පාසල ඔවුන්ට දියණිය ඇතුලත් කල හැකි එකම පාසලයි. ප්‍රධාන නගර වල දෙමව්පියන්ට මෙන් ලිපිනය මාරු කිරීම්, ජල සහ විදුලි බිල්පත් වෙනස් කිරීම්, අල්ලස් දීම ආදි කිසිදු ප්‍රශ්නයක් ඔවුන්ට තිබුනේ නැත.

සරීනා සහ මුසාමිල්ට ඇති ලොකුම ප්‍රශ්නය දරුණු ආර්ථික ප්‍රශ්නයයි. දියණියට පාසල් නිල ඇඳුමක් මසා දීම ඔවුන්ට සෑහෙන අමාරු කාර්යයක් විය. රජයෙන් නොමිලේ ලබා දෙන නිල ඇඳුම් නිසි පරිදි නොලැබීම නිසා ඔවුන් මේ අමාරු තත්වයට පත් විය. කෙසේ හෝ අඩු මිලකට නිල ඇඳුමක් ලබා ගත හැකි සන්නාලියෙකු ඔවුන් සොයා ගත්තත් ඒ සඳහා ඉක්මනින් මුදල් බැඳිය යුතු බව සන්නාලියා පවසා සිටියේය.

"මුසාමි... දුවගෙ ඇඳුමට හෙට සල්ලි බඳින්න ඕන.. නැත්නම් රසීක් කිව්වා වැඩේ කරන්න බෑ කියල... අනේ අපි කොහොම හරි හෙට ඒක කරන්න ඕන....." සරීනා ආවේගයට පත් වී කීවාය.

"අපි කොහොම හරි ඒක කරමු සරීනා..... අද මම කොහොම හරි මාළු ටිකක් වැඩිපුර අල්ල ගන්න බලන්නම්... ස්ටාර් ඩස්ට් එකේ කෝකියා කිව්ව හෙට මාළු ඕන කියල.. අපිට ඔක්කොම එතනට දීල ඉක්මනට සල්ලි ගන්න පුලුවන්.... එතකොට අපිට මේ වියදම හොයා ගන්න පුලුවන්.... " මුසාමිල් විශ්වාසයෙන් කීය.

"ඔව් මුසාමි.. අල්ලාගෙ පිහිටෙන් අද ඔයාට එහෙම කරන්න පුලුවන් වෙයි...." සරිනා ලොකු බලාපොරොත්තුවක් ඇතුව කීවාය.

තම ආදරණීය දරුවා පාසල් යැවීම වැනි අත්‍යාවශ්‍ය කටයුත්තකට හරි හැටි වත්කමක් නොමැතිවීම දෙමව්පියන්ට අතිශයින්ම වේදනාවක් ගෙන දෙන්නකි.

++++++++

ජිනසේන ඇතුලු පිරිස සභාවේ වියදමෙන් සපයා ගත් නවාතැනට පැමිණ විවේක සුවයෙන් කල් ගත කළෝය.

"ෂා... නියම තැන නේද සමන්... කාමර පහයි.. එතකොටම මුලු හෝටලේම අපේ තමයි...හි.හි.හි.... " ජිනසේන ආලින්දයේ පුටුවක වාඩිවී මුහුද දෙස බලාගෙන කීය.

"ඔව් ඒක හරි ජිනේ.. ජොලියක් දාන්න කියාපු ප්ලේස් එක මචන්..." සමන් ඊට එකඟ විය.

"මේ ජිනේ... තමුසෙට ෂුවර්ද අර ජයනි කෙල්ල වැඩේට කැමතියි කියල?....." ඔවුන් සමග වාඩිවී සිටි රංජිත් ඇසීය.

"මොකෝ නැත්තේ රංජි... මගේ යාලුවා දේවක කියපු විදියට ඕකි නියම භාණ්ඩයක් තමයි.. ඒ හින්දා නෝ ප්‍රොබ්ලම්... හි.හි.හි... පොඩ්ඩක් ඉන්නවකො අද රෑ වෙනකන්....."

"මම මාර අමාරුවෙන් බන් බස් එකේ ආවෙ... මට ඕකි දැකල ඇවිස්සිලා තියෙන්නෙ.. කොහෙද.. මේ පොඩි ඒවුන් එක්ක මුකුත් කරන්න බැහැනෙ...." රංජිත් කීවේය.

"මෙච්චර ඉවසපු එක තව පොඩ්ඩක් ඉවසනව අයිසෙ...." ජිනසේන පිළිතුරු දුනි.

ළමුන් සියලු දෙනාම මුහුදු වෙරළට ගොස් රළ පාගමින් එකිනෙකා සමග ඉතා විනෝදයෙන් සෙල්ලම් කළෝය.

"ළමයි ටික නම් මාර විදියට එන්ජෝයි කරනව නේද සමන්...." ජිනසේන පැවසීය.

"මම්... ඔව්.. අපේ අධ්‍යාපන ගමන මාර සාර්ථකයි නේද... හි.හි.හි..."

"ඔව් බන්... උන්ටත් ජොලියක් දීල අපිත් ආතල් එකක් ගනිමු... මේ අපිත් තව ටිකකින් යමු බීච් එකට... කෝ අපේ කෙල්ලො ටික?....."

ජිනසේන මෙසේ කියන විටම කොට කළිසම් සහ දුහුල් කමිස වලින් සැරසුන නිලූකා, ඉමේශා සහ ජයනි එතැනට පැමිණියෝය.

"ඇයි මොකෝ... මේ අපි ඉන්නවා... අපි දැන් බීච් එකට යනවා.. සර්ලත් එන්න..." නිලූකා ජිනසේන ඇතුලු පිරිසට කතා කළාය.

ඇඟෙන් බාගයක් නිරාවරණය වන සේ කොට කළිසම් සහ කමිස වලින් සැරසී සිටි තරුණියන් දුටු විට පිරිමි තිදෙනාම පෙළඹවීමකට පත් විය.

"හරි හරි.. අපි එන්නම්.. ඔය ගොල්ලො යන්න බීච් එකට...."

නාරි දේහයේ ලාවණ්‍යය පෙන්නමින් වෙරළ දෙසට යන තරුණියන් තිදෙනා දෙස ඔවුන් ඇසි පිය නොහෙලා බලාගෙන සිටියහ.

"අද නම් රෑ වෙනකන් ඉන්න බැරි වෙයි බන්..." රංජිත් පෙළඹවීමේ උන්මාදයෙන් පැවසීය.

"ඉන්න වෙනව බන්.. මේ පොඩි ඒවුන් ටිකත් එක්ක මුකුත් කරන්න බැහැනෙ... මේ කෙහෙම්මල් අධ්‍යාපන චාරිකාව පැත්තක තියල මුන් තුන් දෙනා විතරක් උස්සගෙන ආවනම් ඉවරයි...." සමන් පැවසීය.

"හ්ම්.. දැන් කරන්න දෙයක් නෑ... මේ ඒක නෙමෙයි සමන්..... මේ පැත්තෙ පන්සලක් තියෙනවලු මුහුදු මහා විහාරෙ කියල.. යමුද ඒක බලන්න..." ජිනසේන ඇසීය.

"මොන පන්සල්ද බන් අපිට...."

"නෑ බන්.. නිකන් ඉන්න එකේ ගිහින් බලමු...."

පොතුවිල් මුහුදු මහා විහාරය ශ්‍රී ලංකාවේ වීර මාතාව වූ විහාර මහා දේවිය ගොඩ බට ස්ථානය යයි ජන ප්‍රවාදයේ සඳහන් වේ. මුස්ලිම් ගම්මානයක් මධ්‍යයේ පිහිටියද මුහුදු මහා විහාරයේ ස්වාමීන් වහන්සේ සහ ගම් වැසියන් අතර ඇත්තේ ඉතා හිතවත් අන්‍යෝන්‍ය සම්බන්ධතාවයකි. ඉතාමත්ම සාමයෙන් සහ සහජීවනයෙන් කල් ගත කරන ගම් වැසියන් සහ මුහුදු මහා විහාරයේ ස්වාමීන් වහන්සේ පටු ජාතිවාදය අවුස්සමින් ශ්‍රී ලාංකිකයන් ජීවිත පරිත්‍යාගයෙන් ලබාගත් සාමය නැති කිරීමට යත්න දරන ජාතිවාදි කණ්ඩායම් වලට මහඟු ආදර්ශයකි.

හැකි පමණ කාලයක් මුහුදු වෙරළේ විනෝද වුන ජිනසේන ඇතුලු පිරිස හවස් යාමයේ මුහුදු මහා විහාරයට පැමිණියහ. ඔවුන් පිළිගත් නායක ස්වාමින් වහන්සේ පලමු කොට කෙටි ධර්ම දේශනයක් වදාළහ.

"මේ පිරිස දුර බැහැර ඉඳල මේ ඓතිහාසික පන්සලට ආපු එක ගැන මම ගොඩක් සන්තෝස වෙනවා... මේ පන්සල් භූමියේදි තමයි කාවන්තිස්ස රජ්ජුරුවන්ට විහාර මහා දේවිය මුණ ගැහුනේ......." ස්වාමීන් වහන්සෙ දේශනා කලහ.

"කවුද බන් කාවන්තිස්ස කියන්නෙ?..." සමන් ජිනසේන ගෙන් කොඳුරා ඇසීය.

"කවුරු වුනාම අපිට මොකද බන්.. සද්ද නැතුව ඉඳපන්..."

අටවන ශ්‍රේණියවත් සමත් නැති ජිනසේන සහ සමන් කාවන්තිස්ස රජු ගැන නොදැන සිටීම පුදුමයක් නොවේ. ස්වාමීන් වහන්සේ දේශනාව කරගෙන ගියාහ.

"මේ වැඩිහිටි කට්ටිය.. මේ මල් වගේ ඉන්න පුංචි දරුවන්ට ආදර්ශයක් වෙන්න ඕන... පන්සලකට එනකොට ටිකක් සංවර විදියට අඳින්න පළඳින්න ඕන... මෙතැනදී වැඩිහිටියන් ළමුන්ට මග පෙන්වන්න ඕන... මම දන්නවා මේ අය විනෝද ගමනක් ආවා කියලා.. ඒ වුනත් පන්සලක් කියන්නෙ පූජනීය ස්ථානයක් කියන එක හිතේ තියා ගන්න ඕන....."

ස්වාමීන් වහන්සේ ගේ මේ වචන ඇසුන තරුණියන්ට කර කියා ගත හැකි දෙයක් නොමැති වුනා. ඔවුන් තිදෙනාම නිරාවරණය වී තිබූ සිරුරේ කොටස් අතින් වසා ගැනීමට තැත් කළ නමුත් සාර්ථක වූයේ නැත. පාසල් යන වයසේ ළමයෙකු වුවත් කලවා යන්තමට වැසෙන සේ කොට කළිසමක් ඇඳ සිටි ප්‍රසාදිට පොළව පලා ගෙන යාමට සිතුනි.

ස්වාමීන් වහන්සේගේ දේශනය අවසාන වූ විගස ඔවුන් වහා විහාරයෙන් පිට විය.

"මේ ... මම කිව්ව උඹට පන්සලට එන්න එපා කියලා.. කෝ ඇහුවද?...." සමන් ජිනසේනට නෝක්කඩු කීවේය.

"කොහෙද... මේ කෙල්ලො ටික කකුල් ඔක්කොම පේන්න කොටවල් ගහගෙනනෙ ආවෙ......"

"ඉතින් අපි ආවේ ෆන් ට්‍රිප් එකක් මිසක් පන්සල් ගිහින් සිල් ගන්න නෙමෙයිනෙ... සර් මොකටද අපිව පන්සල් එක්ක ආවෙ?...." ඉමේශා තරහෙන් ඇසුවාය.

"හරි හරි මේ... දැන් ඉක්මනට හොටෙල් එකට යමු..." රංජිත් කීය.

පිරිස නික්ම ගිය පසු විහාරාධිපති ස්වාමීන් වහන්සේ පන්සලේ ආරක්ෂාවට සිටින විශේෂ කාර්ය බලකායේ සෙබළා සමග කතා කළහ.

"මට පේන්නෙ දේශපාලනයට සම්බන්ධ කට්ටියක් වගේ.. ඔහොම තමයි.. ගෑණු ළමයි අරගෙන නොසංඩාල කමේ යනවා... ඕන දෙයක් කරාට අපිට කමක් නැහැ.. මෙතනට ඇවිල්ලා මේ ශුද්ධ භූමි කැත කරන්නෙ නැතුව....." ස්වාමීන් වහන්සේ පැවසූහ.

ලොකු තැන් වල සිටින බොහෝ දෙනා අද පන්සල, පල්ලිය, ආගම පාවිච්චි කරන්නේ තමන්ගේ ආගමික විශ්වාසය රටට පෙන් වීමට මිස හදවතින් ජනිත වන ආගමික හැඟිමක් හෝ මෛත්‍රී සිතක් නිසා නොවේ.

++++++++

එදා මුහුදු යන ගමන වෙනදාට වඩා මුසාමිල්ට වැදගත් ගමනක් විය. පසුදා දියණියගේ නිල ඇඳුමට අවශ්‍ය මුදල් සෙවීමට නම් දැළට අසුවන මසුන් ප්‍රමාණය කෙසේ හෝ වැඩි කර ගත යුතුය. මේ හේතුව නිසා මුසාමිල් යම් විදියක ආතතියකට පත් විය.

හෙනහුරා කඩා වැටෙන්නේත් හිඟන්නාගේ පාත්තරයට කිවාක් මෙන් එදින සවස් කාලයේ ධාරානිපාත වැස්සක් ඇද හැලෙන්න පටන් ගැනින. ගොඩබිම ප්‍රදේශයේ සුළඟ එතරම් දරුණු නොවුනත් මහා සාගරයේ කුණාටු ඇති විය හැකි බව අත්දැකීමෙන් මුසාමිල් දන්නා දෙයකි.

"අනේ මුසාමි.. අද හරියට වැස්ස.. අනේ ඔයාට අද මූදට යන්න පුලුවන්ද?... අමාරු නම් යන්න එපා.... මම හෙට කොහොම හරි පළතුරු වැඩියෙන් විකුණල ඕන කරන සල්ලි හොය ගන්නම්.. අනේ මූද සැර නම් යන්න එපා...." සරීනා බිය මුසු ශෝකයෙන් කීවාය.

"ඔයා බය වෙන්න එපා සරීනා... මීට වැඩිය වැස්සෙත් මම මූදු ගිහින් තියෙනවා.... මට මගේ ඔරුවයි හබලයි විශ්වාසයි.. අන්වරුත් මාත් එක්ක යනව නෙ.... ඔයා බය නැතුව ළමයි දෙන්නා බලාගෙන ඉන්න සරීනා... අපි කොහොම හරි අද මාළු ඇති වෙන්න අල්ල ගෙන එනවා..." මුසාමිල් දැඩි අධිෂ්ඨානයෙන් කීය.

"හ්ම්.. අනේ මම දන්නෙ නෑ මුසාමි.. ඔව් මම දන්නව ඔයා බය නැති කෙනෙක් කියල... එහෙනම් පරිස්සමින් ගිහින් එන්න.... ඔයාට අල්ලාගේ පිහිටයි මගෙ මුසාමි..." සරීනා කඳුලු හිර කර ගෙන කීවාය.

සරීනාට උණුසුම් හාදුවකින් සංග්‍රහ කල මුසාමිල් තම ධීවර ආම්පන්න රැගෙන මොර සූරන වැස්සේ නිවසින් පිට වී වෙරළේ නවතා තිබූ ඔරුව දෙසට ගියේය. සරීනා ඔහු නොපෙනී යන තුරුම කඳුළු පිරි දැසින් ඔහු දෙස බලා සිටියාය.

ගතේ සවියෙන් සහ හිතේ වීරියෙන් ධීවර කර්මාන්තයේ යෙදෙන මුසාමිල්ට ලෙඩ නිවාඩු, ආපද නිවාඩු, විනෝද නිවාඩු ආදි කිසිවක් නොමැත.

++++++++

එදා රෑ නවාතැනේ ජිනසේන ඇතුලු පිරිස මහා සාජ්ජයක් පැවැත් වීමට කටයුතු සම්පාදනය කළෝය. මෙම සාද වලදි කිසිදු ගණනක් මිම්මක් නොමැතිව මත් පැන් පාවිච්චිය සිදුවන නිසා ඒ සඳහා අවශ්‍ය සියලුම දෑ ජිනසේන සහ සමන් විසින් කිසි අඩුවක් නොමැතිව සකස් කොට තිබින. 'මතට තිත' රටේ සංකල්පය වුනත් 'තිතට මත' යනු මොවුන්ගේ සංකල්පය විය.

ජිනසේන සහ සමන්ට දෙවැනි නොවනු පිණිස රංජිත්ද මේ සාජ්ජයට දායක විය.

"මේ ජිනසේන... ඔන්න මමත් නියම බඩු ටිකක් ගේන්න කියල මැන් කෙනෙක්ට කිව්වා..." රංජිත් උජාරුවෙන් කීය.

"ඒ මොනවද රංජි?......"

"මගේ ගෝලයෙක් ඉන්නවා පානම පැත්තේ. මිනිහා එවන්නම් කිව්වා හොඳට මිරිස් දාල හදපු මුව මස් කිලෝ දෙක තුනක්... බයිට් එකට නියමයි නේද..හි.හි.හි.."

"මුව මස්?....." ජිනසේන මදක් වික්ෂිප්ත වී ඇසීය.

"ඔව් උණු උණුවෙ මුව මස්...ඕව කවද කන්නද?...ඇයි උඹල කැමති නැද්ද?....."

"අ...නෑ.. මේ.. මම නිකමට කිව්වෙ.."

ආරක්ෂිත ප්‍රදේශ තුලදී මුවන් මැරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වාරණය කර ඇති දඬුවම් ලැබිය හැකි වරදකි. එහෙත් මෙය තුට්ටුවකට ගණන් නොගන්නා දඩයක්කාර නරුමයන් මස් පිණිස මුවන් මැරීම රිසි සේ සිදු කරති. රංජිත් වැනි බන්ධනාගාර නිලධාරියෙකු මෙවැනි නීති විරෝධී ක්‍රියා වලට උල් පන්දම් දීම රටේ නීතිය වල් වැදීමේ තවත් පැතිකඩකි.

බන්ධනාගාරය තිබෙන්නේ වැරදි කලවුන් පුනරුත්තාපනය කිරීමටය. කෙසේ වෙතත් පළමු කොට කල යුත්තේ බන්ධනාගාරය භාරව සිටින අයවලුන් පුනරුත්තාපනය කිරීමය.

"අද රෑ නියමෙට වහිනවා නේද... පාටි එකට නම් නියමයි එළියෙ වහින කොට... නේද සමන්?..." ජිනසේන මත් පැන් බෝතල් දෙස බලමින් කීය.

"පාටි එකට වඩා පාටි එකට පස්සේ වැඩ වලට තමයි වැස්ස නියම..හි.හි.හි.."

"ඉඳපන්කො..ඉස්සෙල්ලා හොඳට දාලා සිංදුවක් එහෙම කියල ඉඳිමුකො.. පොඩි ඒවුන්ටත් ජොලියක් තියෙන්න ඕන නෙ..."

ජිනසේන, සමන් සහ රංජිත් මුව මස් කට ගැස්ම කමින් රිසි සේ මත් පැන් පානය කරන්නට පටන් ගත්හ. ඔවුන් කුමාර පදමට ඒමට වැඩි වේලාවක් ගත වූයේ නැත. නවාතැනෙන් සපයන ලද ආහාර වලින් සහ සිසිල් බීම වලින් සප්පායම් වූ ළමුන් සිංදු කියමින් නටන්නට විය. ළමුන් පිරිසට නිලූකා, ඉමේශා සහ ජයනිද සම්බන්ධ විය. නවාතැනේ ශාලාව එකම බයිලා සාජ්ජ නැටුම් පිටියක් බවට පත් විය.

සිරුරෙන් තුන් කාලක් පමණ නිරාවරණය වූ ඇඳුම් වලින් සැරසී කිසිම වාරයක් නොමැතිව බයිලා තාලයට නටන මේ තරුණියන් සහ ගැහැණු ළමුන් දුටු විට තවුසන්ගේ වුවද දැහැන බිඳේ. එබැවින් ජිනසේන, සමන් සහ රංජිත්ට ඇතිවූ හැඟීම් ගැන විස්තරයක් කිරීම අවශ්‍ය නැත.

***නාරිලතා පුෂ්පේ......***
***විෂ සෝර නාද විෂ කලතා***
***සූකිරි කැටද පැණී එහි දවටා***
***කල කලා සැටක් සිව් මායමේ***
***බඹා මැව්ව ස්ත්‍රී.........***
***බඹා මැව්ව ස්ත්‍රී ලෝකෙට..... නාරිලතා පුෂ්පේ***

මත් පැන් පදමින් බාගෙට සිහිය විකල් වී සිටින තිදෙනාට අඩ නිරුවතින් නටන මේ ළඳුන් නිසා ඇතිවූයේ සියලු සාරධර්ම වල සීමාව ඉක්මවූ තිරශ්චීන ආශාවකි.

"ම්..මෙ..ම්.මෙ.ජී..ජිනේ... අර ප්‍ර.. ප්‍රසාදි කෙල්ලත් නි..නියමයි නේද.. පො..පොඩි වුනාට හො..හොඳට ඇඟ හැ.. හැදිල...." පදම ඉක්මවා සිටි සමන් කීය.

"මේ..බො..බොට පි..පිස්සුද...ඕකිට මො.. මොනව හරි ක..කලොත් ගෙ... ගෙදර ගිහිල්ල ඉ..ඉවරයි... උ..උඹ ඉ..ඉමේශත් එක්ක ඕන එකක් කර ගනින්..."

සමන්ගේ මේ ඉරියව් ළමුන්ටද දැනින.

"මේ අක්කෙ... අර සමන් කියන එකා අක්කා දිහා කන්න වගේ බලාගෙන ඉන්නවා...." නැටුම අස්සෙන් සෙව්මිනි ප්‍රසාදිට කිව්වාය.

"ගණන් ගන්න එපා නංගි...ඕකුන්ට කෙල්ලෙක් පේන්න බෑ... අපි දැක්කෙ නෑ වගේ ඉදිමු.."

තද වැසි සහිත සීතල කාළගුණය නිසා පිරිමින් තිදෙනාගේ හැඟිම් තවත් උද්දීපනය විය.

"ජිනේ.. දැ..දැන් නම්..ඉ ඉන්න අමාරුයි..පො..පොඩි උන් නින්දට දා..දාපන්...." සමන් ඉවසා සිටිය නොහැකි තැන කීය.

"හ..හරි..ඉ..ඉඳපන්...."

ජිනසේන ළමුන්ගේ බයිලා සාජ්ජය නවත්වා ඔවුන්ට නින්දට යන ලෙස නියෝග කළේය.

"බලන්නකො අක්කෙ... අපේ ජොලිය බාගෙට නවත්තල අපිට නිදා ගන්න කිව්වා... " සෙව්මිනි නාහෙන් අඬ අඬා කිව්වාය.

"ඔය පිරිමින්ට අක්කල එක්ක සැප ගන්න තියෙන තදියම හින්ද නෙ නංගි... "

"ඉතින් අක්කෙ..ඒකට අපේ සන්තෝසෙ නැති කරල හරියනවද?..."

"මේ නංගි.. අපිට ඕව වැඩක් නෑ... අපිට තියෙන්න අපි ටික එකතු වෙලා එන්ජෝයි කරන එක විතරයි... දැන් අපි නිදා ගනිමු....

හෙට කුමන යනවනෙ..එතකොට අපි බස් එකේ සිංදු කිය කිය යමු....."

වැඩිහිටියන් වශයෙන් මේ පිරිස මල් වයසේ සිටින යෞවන යෞවනියන්ට දෙන ආදර්ශය ශිෂ්ට සමාජයකට අනුමත කල නොහැකිය.

++++++++

මහා සාගරයේ වර්ෂාවත් සමග තද චණ්ඩ කුණාටුවක් ඇති විය. මුහුදු රළ තරංග ඉතා දරුණු ලෙස රළු විය. මුසාමිල් සහ අන්වර්ගේ දෑතේ සවියෙන් ඔරුව හබලෙන් පාලනය කිරීම ඉතා අපහසු විය. ඔරු කඳ උඩින් ගලාගිය රළ පහරවලින් ඔරුව තුල වතුර එකතු වීමට පටන් ගැනින.

"අන්වර්... මූද මාර සැරයි අද.. ඒ මදිවට වැස්සයි කුණාටුවයි..... පුලුවන් තරම් හබලෙන් ඔරුව කෙළින් තියා ගන්න බලපන්... මාළු අයින ළඟට යන්න ටිකක් අමාරුයි... ඒත් කොහොම හරි යන්න ඕන...."

වැස්සෙන් සහ සුළඟින් මහත් පීඩාවට පත්ව සිටින මුසාමිල් කීය.

"මුසාමිල් අයියා.... අද නම් ටිකක් වැඩේ කනපිට හැරෙන්නයි යන්නෙ... හබල ගහන්න අමාරුයි අයියා..." අන්වර් තැති ගැනීමකට පත් විය.

"අන්වර්... මම කොහොම හරි ඔරුව කෙළින් තියා ගන්නම්... උඹ මේ බාල්දියෙන් වතුර හිස් කරපන්... නැත්නම් ගොඩක් එකතු වුනොත් වැඩේ භයානක වෙන්න පුලුවන්....."

"හරි අයියා.. මම ඒක කරන්නම්....."

"මාළු දැල පරිස්සම් කර ගනින්.. ඒක නැතුව අපි ආපු ගමන වැඩක් නැති වෙනවා..."

මුසාමිල් සිය බාහුවල උපරිම ශක්තිය යොදවා ඔරුව පාලනය කිරීමට දැඩි උත්සාහයක් ගත්තේය. අන්වර් ඔරු කඳේ එකතු වුන මුහුදු ජලය වේගයෙන් හිස් කරන්න ගත්තේය.

ඇති වී තිබෙන තත්ත්වයේ භයානක කම මුසාමිල්ට හොඳ හැටි තේරුම් ගියේය. එහෙත් ඔහු දැඩි අධිෂ්ඨානයෙන් හා වීර්යයෙන් ඔරුව පාලනය කිරීමට සෑම උත්සාහයක්ම ගත්තේය. සරීනාගේ අහිංසක, ධෛර්යමත් බවින් යුතු මුහුණ ඔහුට මැවී පෙනින. මෙය ඔහුට විශාල ශක්තියක් විය. වර්ෂාවත්, කුණාටුවත්, සැඩ රළ පහරත් අබිබවා ගොස් කෙසේ හෝ තම ඉලක්කය වූ මසුන් අල්ලා ගැනීමට යෝධ හයියක් ඔහුගේ ගතට සහ සිතට දැනින.

++++++++

නිලූකාගේ නග්න සිරුරෙන් තම කාමුක මන දොල සන්තර්පණය කරගත් ජිනසේන ඇය තුරුලු කොට ගෙන ඇඳේ වැතිරී සිටියේය.

"නිලූකා... කොහොමද ඔයාට?...."

"ම්ම් සර්... මට උදේට ඇඳෙන් නැගිට ගන්න පුලුවන් වෙයිද දන්නෙ නෑ...." නිලූකා හෙමින් මිමිනුවාය.

"අයියෝ... එහෙම වෙන්නෙ නෑ ළමයෝ... හි.හි.හි..."

"මට ඉමේශා එක්ක මාර ඉරිසියයි සර්......"

"ඒ මොකෝ නිලූකා?....."

"නෑ ඉතින්... එයාට මේ සැප නිතරම හම්බ වෙනවනෙ...."

රති සැපයෙන් සන්තර්පණය වූ පිරිමින්ගේ දුර්වලතා හොඳින් දන්නා නිලූකා මෙසේ ඇගේ හැට හතර මායමින් එකක් පාවිච්චි කළාය.

"අයියෝ නිලූකා.... ඔයත් මීට පස්සෙ මාත් එක්ක ඉන්නකො...."

"ඔය ඇත්තමද සර්?....."

"ඔව් ළමයො ඔව්..."

"මේ සර්....." ජිනසේනට කාමුක ස්පර්ශයක් දෙමින් නිලූකා ඇසුවාය.

"ඇයි නිලූකා?...."

"සර්... මට ලෝන් එක තව පනස්දාහක් විතර වැඩි කරල දෙන්න පුලුවන්ද?..."

හැට හතරින් තවත් එකක් නිලූකා ඉස්සරහට දැම්මාය.

"ආ.... මම ඒක කරල දෙන්න නිලූකා.. ඒක සුළු දෙයක්....."

"ම්ම්ම්....තැන්ක් යූ සර්.... සර්... අර ලෝන් ඔෆිසර් මට හරියට ගෙම්බර් දැම්මා... බොරු දේවල් අල්ලගෙන මට හරියට කරදර කරා... මිනිහ හැදුවා මාව ඇඳට ගන්න.... මම කැමති වුනේ නැති නිසා බොරු හේතු හදා ගෙන ලෝන් එක පරක්කු කරා...."

"මොනවා?????... ඌ ඔයාට එහෙම යෝජනාවක් කරා?..."

"ඔව් සර්....."

"හරි ඉන්නකො... මම ඕකව තුත්තුකුඩියට මාරු කරනව.... මීට පස්සෙ ඔයාට කරදර කරන එකක් නෑ..."

අවංක ලෙස නීතියට සහ හෘද සාක්ෂියට එකඟව තම රාජකාරිය ඉටුකල තවත් නිලධාරියෙක් සමාජ අසාධාරණය නිසා මෙසේ දඬුවමට පාත්‍ර විය.

"ම්ම්ම්ම් සර්.... ෂෝක් එකට වහිනවා නේද... අපි තව ටිකක් සැප ගනිමු සර්....."

"හරි පැටියෝ... මම ඔයාට දිව්‍ය ලෝකෙ පෙන්නන්නම්....."

ගැහැණියකගේ හැට හතර මායමට මුළු රටක් වුවද දවා අළු කල හැකිය.

++++++++

රාත්‍රියේ මොර සූරන වැස්ස නිසා සරීනාට නිදා ගැනීමට අපහසු විය. මුහුදේ රළ පහර සහ සුළඟ සමග ජීවිත සටනක් ගෙනයන මුසාමිල්ගේ ප්‍රතිරූපය ඇගේ සිතේ ඇඳෙන්නට විය. මේ නිසා ඇය මහත් භීතියටත්, කම්පාවටත් පත් වූවාය.

*"අනේ මගේ මුසාමිට අල්ලාගේ පිහිටයි... කිසිම කරදරයක් වෙන්න එපා දෙයියනේ.. අනේ එයා අද මූදු ගියේ නොගිහින් බැරි හින්දා... අනේ එයාව බලාගන්න...."*

සරීනා පැදුර මත දණ ගසා යාඥා කරන්න පටන් ගත්තාය. එහෙත් ඇයට බිය සහ දුක වාවා ගැනීමට නොහැකි විය. මේ නිසා ඇය පැදුරෙන් නැගිට ගොස් දොර විවෘත කොට එළිය බැලුවාය. කැලි කැපිය හැකි ගණ අඳුරත්, මොර සූරන වැස්සත් නිසා ඇයට කිසි දෙයක් පෙනුනේ නැත.

*"අනේ..මේ වැස්ස නවත්තන්න.. දෙයියනේ... මේ වැස්ස නවත්තන්න... මගේ මුසාමිට පිහිට වෙන්න....."*

අඳුරට කෑ ගසා මෙසේ පැවසූ සරීනා නැවත පැදුරට ගොස් තම දරුවන් දෙදෙනා තුරුලු කර ගත්තාය.

එකම ප්‍රදේශයේ එකම තැනකට අද හැලෙන මේ ධාරානිපාත වැස්ස කෙනෙකුට සතුටත් කෙනෙකුට දුකත් එකවිට ගෙන දීම දෛවයේ කවර නම් සරදමක් විය හැකිද?

++++++++

"සර්.... වහිනකොට මෙහෙම ඉන්න එක ගොඩක් සැපයි නේද?...."

බන්ධනාගාර සහකාර අධිකාරී රංජිත්ට තුරුලු වී සිටි බන්ධනාගාර රැකියා අපේක්ෂිකා ජයනි මෙසේ පැවසුවාය.

"ඔව් කෙල්ලෙ.. අද රෑ වැස්ස එක කොච්චර ෂෝක්ද.... අපි දෙන්නගේ සැප ඩබල් වුනා නේද?....."

ජයනිගේ පහසින් කුල්මත් වී මුලු ලෝකයම අමතක වී සිටි රංජිත් කීය.

"සර්.. මගේ ජොබ් එක ෂුවර් නේද?....."

"ෂුවර් ඇන්ඩ් ෂොට් කෙල්ලේ.... මම හෙටම කෝල් එකක් දෙනව A.O. ට... ඔයාට සුමාන දෙකකින් ජොබ් එක පටන් ගන්න පුලුවන්....."

"ම්ම්ම්ම්.. තැන්ක් යූ වෙරි මච් සර්......" ජයනි තොදොල් වී කිව්වාය.

"එන්න කෙල්ලෙ... එළි වෙන්න තව වෙලා තියෙනවා... ඔයා හින්ද මට පිස්සු හැදිල තියෙන්නෙ....."

"මේ.. සර්ගෙ වයිෆ් දැන ගත්තොත් ලොකු අවුලක් වෙයි නේද...."

"එයාට මේව අහු වෙන්නෙ නෑ... මම එයාට ළමයි දෙන්නෙක් දීල තියෙනව... එයා ඒ ගොල්ලො බලාගෙන ඉඳීවි... මේ.. ඔය අනම් මනම් කතා නවත්තලා අපි තව සැප ගනිමු...."

දෙදෙනා නැවතත් දැඩි ආලිංගනයකින් එකට එකතු විය. තිරශ්චීන කම් සැප විඳීමේ සීමාවක් නොමැත.

++++++++

අධික වර්ෂාව සහ සැඩ රළ පහර සමග අධිෂ්ඨානයෙන් පොර බැදූ මුසාමිල් ඔරුව මහ සාගරයේ අවශ්‍ය ස්ථානයට ගෙන ගියේය. සුළඟ මදක් අඩු වීම ඔහුට යම් විදියක පහසුවක් විය.

"අන්වර්... දැළ දිග ඇරපන්.. කොහොම හරි දැළ දාගන්න ඕන.. නැත්නම් අපි අනාථයි..."

"මුසාමිල් අයියා.. රැල්ල සැරයි.... දැළ අතුරන්න අමාරුයි... ඔරුව ගැස්සෙනවත් වැඩියි....."

"ඔහොම බය වෙලා බෑ අන්වර්... අල්ලපන් එහා කෙළවරෙන්.... කොහොම හරි දාන්න ඕන...."

මුසාමිල්ගේ දිරියෙන් තල්ලුවක් ලැබුන අන්වර් මුසාමිල් සමග එකතුව දැළ එළා ගත්තේය. දැළ දමන විටම මතුවූ විශාල රළ පහර නිසා ඔරුවේ සමබර තාවය නැතිවී පෙරලිමට ගියේය. කෙසේ හෝ තම කාය ශක්තියේ බලයෙන් මුසාමිල් සහ අන්වර් ඔරුව කෙළින් තියා ගත්තෝය.

"අයියා... තව පොඩ්ඩෙන් ඉවරයි අයියා... ඔරුව පෙරලුන නම් අපි දෙන්නම ඉවරයි...." බියට පත් අන්වර් කීය.

"අන්වර්... එහෙම දෙයක් වුනේ නැහැනෙ.... හිතට හයිය ගනින්... මේ රස්සාව කරන්න මූද එක්ක ඔට්ටු වෙන්න ඕන...."

වර්ෂාවෙන් තෙතබරි වී සුළඟෙන් සහ රළ පහරින් අධික පීඩාවට පත් මුසාමිල් සහ අන්වර් දැළ එලීමෙන් පසු සියලු වෙර වීරිය යොදා ඔරුව පාලනය කර ගත්තෝය.

මෙතරම් වෙහෙසක් සහ ජීවිතයත් මරණයත් අතර සටනක් කරමින් සාගරය සමග පොර බැදූ ඔවුන්ගේ දැළට මුහුදේ සිටින අනේක විධ මත්ස්‍යයින්ගේ ආගමනයක් සිදු වෙයිද?

++++++++

"ඉමේශා....."

තමන් සමග යහනේ වැතිර සිටින ඉමේශාගෙ ඔලුව සෙමින් අතගාමින් සමන් මිමිනුවේය.

"ම්ම්ම්ම්..." ඉමේශා හෙමින් කෙඳිරි ගෑවාය.

"නිදි ද?...."

"ම්ම්.. නෑ සර්... අම්මෝ.. මම හිතුව මම මැරෙයි කියල...."

"ම්ම්... මේ.. මමද ජිනසේනද වැඩියෙන් හොඳ?...."

"මන් දන්නෙ නෑ...."

"ම්ම්.. කට්ට කෙල්ල නේද..ආ.. මේ... අපි මීට පස්සෙ දිගටම මෙහෙම කරමු හොඳේ.. ඔයා ජිනේගෙ ප්‍රයිවට් සෙකට්‍රි වුනාට කමක් නෑ...."

"ඔව් ඉතින්...සර් මට කෙළ හල හල හිටිය කියල මම දන්නව නෙ....."

"ආ... ඒ කියන්නෙ ඒකත් දැනිල තියෙනව නේද හොර කෙල්ල...... මේ.. අර ඔයා ගෙනාපු කෙල්ලො හතර දෙනත් මරු නේද?... වැඩියෙන්ම ප්‍රසාදි කෙල්ල....."

"මේ.. මම එකක් කියන්නම්... උන්ට අතවත් තියන්නෙ එහෙම නෑ... බාලාපරාධ කරොත් සර්ලගෙ දේශපාලන බලයෙන් වුනත් බේරෙන්න බැරි වෙයි.. හිරේ තමයි තපින්න වෙන්නෙ..."

"ආ... නෑ.. මම මේ නිකමට කිව්වෙ...."

"නිකමට වුනත් කියන්න එපා... දැන් නිදා ගනිමු.. හෙට කුමන යන්නත් තියෙනව....."

ඉමේශාට සුලුවෙන් හෝ මෙවැනි සංයමයක් තිබීම සැනසීමට කරුණකි.

++++++++

පසුදා උදෑසන ආරුගම් බොක්කේ සූර්ය උදාව වන විට වැස්ස සහ සුළඟ සම්පූර්ණයෙන්ම නැවති තිබිනි. ක්ෂිතිජයෙන් නැග එන හිරු සැමගේම සිත් සතන් පුබුදු කිරීමට සමත් විය.

සූර්ය උදාව නැරඹීමට දේශීය සහ විදේශීය සංචාරකයන් කිහිප දෙනෙක් ආරුගම් වැල්ලට පැමිණ සිටියාහ. ඔවුන් සියලු දෙනාම ගතවූ රාත්‍රියේ සුව නින්දක් ලබා ඇති බව මුහුණු වලින් පෙනෙන්නට තිබින. මුසාමිල් වැනි ධීවරයන් මහ සාගරය මධ්‍යයේ බඩ වියත රැක ගැනිමට ජීවිතයත් මරණයත් අතර කල සටන ගැන මොවුන්ට කිසිදු අවබෝධයක් නොතිබුන බවට සැකයක් නොමැත.

මුසාමිල් සහ අන්වර් ඔරුව ගොඩබිමට පැදවූයේ හැකි ඉක්මනින් දැළට හසුවූ මසුන් අලෙවි කිරිමේ බලාපොරොත්තු වෙන්ය. 'ස්ටාර් ඩස්ට්' අවන් හලට මාලු තොගය විකිණිය හැකි බව මුසාමිල්ට විශ්වාසය. තම කුඩා දියණියගේ අවශ්‍යතාවය කෙසේ හෝ සපුරාලිය යුතුය.

වැල්ලේ සිටි සහායකයින්ගේ උදව්වෙන් මුසාමිල් ඔරුව වැල්ලට තල්ලු කර ගත්තේ ඉමහත් පරිශ්‍රමයකින් පසුවය. සහායකයින් සිටියද වැල්ලට ඔරුව තල්ලු කිරීම ලේසි පහසු

කාර්යයක් නොවේ. වැල්ලට ගසන රළ පහර සහ වැල්ලේ බැවුම පරදවමින් මේ කර්තව්‍යය කල යුතුය.

මුසාමිල් මාළු දැළ ඔරුවෙන් එළියට ගෙන වැල්ලේ දිග හැරියේ මසුන් විශාල ප්‍රමාණයක් අසුවී ඇතැයි බලාපොරොත්තු වෙනි.

එහෙත් දැළට අසුවී ඇති මසුන් දුටු විට ඔහුගේ මේ බලාපොරොත්තු සියල්ලම සුන් වී ගියේය. මුසාමිල්ගේ හදවත කඩා වැටුනි. දැළට අසුවී සිටියේ සාලයන් කිහිප දෙනෙකු පමණි.

***මූදේ යමු මසුන් මරන්න....***
***දියඹේ ඔරුව දියත් කරන්න....***
***ආහාහා... අඹු දරු රැක ගන්න අපට***
***මාළු ලබා දෙන්න දෙවියනේ....***
***අප රැක ගන්නේ...***

හිස් ඔරුව සහ දැළට අසුවූ සාලයන් කිහිප දෙනා දෙස මුසාමිල් බලා සිටියේ දෙනෙතින් පිටවෙන්නට සැරසුන කඳුලු බින්දු මහත් ආයාසයකින් නවත්වා ගනිමින්ය. ගත සිත වෙහෙසා දහඩිය හෙලමින් වෙහෙසෙන නැති බැරි අයට දෙවියන්ගේ පිහිටක් ලැබෙන්නේ නැතිද?

සූර්ය උදාව බැලීමට පැමිණි එක් දේශීය සංචාරකයෙක් ඔරුව අසලට පැමිණ මාළු දැළ දෙස උපේක්ෂා සහගත බැල්මක් හෙලුවේය. මුසාමිල්ගේ ශෝක හරිත මුහුණ ඔහුගේ ඇස ගැටින.

"මහත්තයා.. අද මගේ පවුල බඩගින්නෙ තමයි....." මැලවුන හඬකින් මුසාමිල් කීය.

සංචාරකයාට විශාල ශෝකයක් දැනින. මුසාමිල්ට උදව්වක් කල හැකි නම් අගනේ යයි ඔහුට සිතුනේය. එහෙත් එවේලේ ඔහු

අත තිබුන රුපියල් දෙදාහක මුදල මුසාමිල්ට දීමට සිතක් පහල නොවූයේ මන්දැයි ඔහුට සිතා ගැනීමට නොහැකි විය.

දැළට අසුවූ මසුන් කිහිප දෙනා එකතු කිරීම අන්වර්ට බාර කල මුසාමිල් සෙමින් සෙමින් නිවස දෙසට ගමන් කළේය.

++++++++

හිරු උදාවී දෙපැයක් ගතවන තුරුත් නිදි යහනේ සුවය ලැබූ ජිනසේන ඇතුලු පිරිස උදය ආහාරය සප්පායම් වී කුමන කුරුළු පාරාදීසයට යාමට සැරසිනි.

"ආ.... ළමයි ඔක්කොම කුමන යන්න හොඳට ලෑස්ති වෙලා තියෙන්නෙ.. කට්ටිය ර්යේ රෑ හොඳට නිදා ගත්තද?....."

ගමනට ලක ලැහැස්ති වී ඇති ළමුන් දුටු ජිනසේන ඇසීය.

"ඔව් අන්කල්... අපි හරීීීීී ෂෝක් එකට නිදා ගත්තා...." ප්‍රසාදි ඔලොක්කුවට මෙන් කිව්වාය.

"ආ.. ඒක හොඳයි..."

"මේ නංගි... මේ ගොල්ලන්ට නම් නිදා ගන්න වෙලාවක් තියෙන්න නැතුව ඇති.... කට්ටිය දන්නෙ නැතුව ඇති අපිට බිත්ති අස්සෙන් ඒ ගොල්ලන්ගේ වැඩවල සද්දෙ ඇහුනා කියල.." ප්‍රසාදි සෙව්මිනිගේ කණට කොඳුරා කිව්වාය.

"ෂ්ෂ්ෂ් අක්කේ.... කට්ටියට ඇහෙයි... බලාගෙන.."

"ඒ ගොල්ලන්ට කරන්න හොඳ නම් අපි කිව්වම මොකද... දැන් මහ ලොකුවට අහනවා අපි හොඳට නිදා ගත්තද කියල.... මෙන්න මෙහෙ එන්න නංගි.. අපි කුමන ට්‍රිප් එක එන්ජෝයි කරමු......"

ප්‍රසාදි සෙව්මිනිත් සමග එතනින් යන්න ගියාය.

++++++++

මුහුදු කුණාටු, වැසි සුළං නොතකා දිවි පරදුවට තබා මුහුදු ගිය ගමනින් අවශ්‍ය ප්‍රතිඵලය නොලැබුන නිසා මුසාමිල් මහත් දෝමනස්සයකට හා ශෝකයකට පත් විය.

"අනේ සරීනා.. අනේ අපි කොහොමද දැන් දුවගෙ වැඩේ කරන්නෙ?.... අනේ කෙල්ලව ඉස්කෝලෙ යවන්න විදියක් නැති වෙයිද?...." සරීනාගේ ඔළුව අත ගාමින් මුසාමිල් කීය.

"මුසාමි.. මේ ඔක්කොම වෙන්නෙ දුප්පත් අපිට තමයි... ඔයා බය නැතුව ඉන්න මුසාමි.... අද මම කොහොම හරි ඇති වෙන්න පළතුරු විකුණල කොහොම හරි මේ සල්ලි හොයා ගන්න එක හොයා ගන්නවමයි...."

සරීනා දැඩි අධිෂ්ඨානයකින් කිව්වාය. සිය බිරිඳගේ නොපසු බස්නා උත්සාහය ගැන මුසාමිල් පුදුමයට සහ සතුටට පත් විය.

"සරීනා.. මට ඔයා ගැන හරිම ආඩම්බරයි කෙල්ලෙ... කොච්චර දුප්පත් වුනත් ඔයා ළඟ ඉන්නකන් මට ඕන දේකට මූණ දෙන්න පුලුවන්... ඔව්.. අපි පුලුවන් විදියට ඉස්සරහට යමු... මමත් අද එනව ඔයත් එක්ක පළතුරු විකුණන්න...."

"එපා මුසාමි... ඔයාට කොච්චර මහන්සිද රෑ මූදෙ ගිහිල්ල... අනික දුවට පොඩ්ඩක් සනීප නෑ... ඔයා දුවත් එක්ක ඉන්න... මම පොඩි පුතාත් එක්ක යන්නම්..... මම අද කොහොම හරි මේ සල්ලි හොයා ගන්නවා...."

පළතුරු වට්ටිය හිසට ගත් සරීනා පොඩි පුතු සමග පානම මාර්ගයේ සුපුරුදු ස්ථානයට යාමට නිවසින් පිටත් වුනාය. දියණිය තුරුලු කරගත් මුසාමිල් ඇය දෙස ශෝකය මුසු දැඩි ආදරයකින් බලා සිටියේය.

++++++++

කුමන චාරිකාව සඳහා ජිනසේන ඇතුලු පිරිස රැගත් බස් රථය නවාතැනෙන් පිටත් වූයේ උදේ දහයත් පසුවූ විටය.

"අද නම් කුරුල්ලො බලන්න වෙන්නෙ නෑ.... කොහෙද මේ ළමයි ලෑස්ති වෙන්න පරක්කු වුනා නෙ...." නිලූකා මැසිවිලි නැඟුවාය.

"හ්ම්... කවුද දන්නෙ නෑ රෑ එළි වෙනකන් සෙල්ලං කරල පරක්කු වුනේ..." ප්‍රසාදි බස් රථයේ ජනේලයෙන් එළිය බලාගෙන කිව්වාය.

පොතුවිල් පානම මාර්ගයේ බස් රථය ඉදිරියට ගමන් කළේය. රථය පිටත් වූ මොහොතේ පටන් ප්‍රසාදි ඇතුලු ළමුන් ගීත ගායනා කරමින් විනෝද වෙන්න පටන් ගත්තෝය.

"මේ ඩ්‍රයිවර්... අර ඉස්සරහ ගෑණු කෙනෙක් පළතුරු වගයක් විකුණනව නේද?... අන්න එතනින් පොඩ්ඩක් නවත්තනවා..." ජිනසේන රියැදුරුට නියෝග කළේය.

බස් රිය නැවැත්වූයේ සරීනා පළතුරු විකුණමින් සිටින ස්ථානයේය.

ජිනසේන, සමන්, රංජිත් සහ තරුණියන් තිදෙනා බසයෙන් බැස සරීනා පළතුරු විකුණන තැනට පැමිණියහ. ළමුන් බසයෙන් නොබැස දිගටම ගීත ගායනය කරගෙන ගියෝය.

"මේ ගෑණියේ... අඹ වල ගණන් කොහොමද?....."

ජිනසේන කිසිම ගරුසරුවක් නැතුව ඇසීය. දුප්පතුන් තම අත පල්ලෙන් වැටුන පිරිසක් යැයි බොහෝ 'ඇති හැකි අය' සිතා ගෙන සිටීම සාමන්‍ය දෙයකි.

"ගෙඩිය රුපියල් තිහයි සර්... ගහේම ඉදුන ඒවා... දුම් ගහල ඉදවල නෑ... ගන්න සර්...." සරීනා ආචාරශීලී ලෙස කිව්වාය.

"රුපියල් තිහයි???.. ඈ බන් ගෑණියේ... උඹ කාගිල් සාප්පුවෙන්ද ආවෙ?... ආ.... සුපර් මාකට් එකේ ඔයිට වඩා හොඳ අඹ ඔයිට වඩා ලාබෙට ගන්න පුලුවන්...." සමන් බුරාගෙන පැන්නේය.

"අනේ සර්... මේවා සියඹලණ්ඩුවෙන් හරිම අමාරුවෙන් ගෙන්න ගන්නෙ... මම කවදාවත් අසාධාරණ විදියට විකුණන්නෙ නෑ...."

"අනේ නිකන් පලයන් බන්... අපි මෝඩයො කියල හිතුවද... උඹල වගේ ඒවුන් හැමෝම ගහන බයිලා එකක් තමයි ඕක.. මේ... ඕන නම් රුපියල් දහයක් දෙන්නම්..." සමන් කීය.

"ඔව් සර්... මේවා දහයට වැඩිය වටින්නෙ නෑ... මම හිතන්නෙ මේ ගෑණි කොහෙන්ද හොරෙන් කඩා ගත්ත ඒවද කොහෙද..." නිලූකා අඹයක් මිරිකන ගමන් කිව්වාය.

"අනේ නෝනා... මම කවදාවත් හොරකම් කරන්නෙ නෑ... මම මේක කරන්නෙ මගේ දරුවො රස්සා කරන්න...." නිලූකාගේ කතාවෙන් දුකට පත් සරීනා පැවසීය.

"ඇයි...උඹට මිනිහෙක් නැද්ද?...." ජිනසේන ඇසීය.

"ඉන්නවා සර්... එයා මාළු අල්ලනවා.. රෑට මූදු ගිහිල්ල අමාරුවෙන් තමයි මාලු අල්ලන්නේ....."

"ආ... ඒ කියන්නෙ උඹ රෑට ගෙදර තනියෙන්ද ඉන්නේ?.. .. ඉතින් ගෑණියේ.... මේ අව්වෙ අඹ විකුණන්නෙ නැතුව රෑට මිනිහ නැති වෙලාවට උඹේ ඔය ලස්සන ඇඟ විකුණපන්කො... හොඳ ගාණක් හොයන්න පුලුවන්... හි.හි.හි...."

ජිනසේන සරීනා දෙස කාමුක බැල්මක් හෙලා කීය. මේ කතාව සරීනාගේ පපුවට පිහි පාරක් මෙන් විය. එහෙත් අසරණ සරීනා ඒ දුක උහුලනවා ඇර වෙන කුමක් කරන්නද? ඇයට කිසිවකුගේ පිළිසරණක් ලැබෙන්නේ නැත. එය දුප්පතුන්ගේ උරුමයයි.

"සර්.... මම ඒ වගේ කෙනෙක් නෙමෙයි...." හදවතේ ඇතිවූ වේදනාවත්, දෑසින් පිටවන්නට ආ කඳුලුත් අමාරුවෙන් හිර කරගෙන සරීනා කිව්වාය.

"අනේ බන්... උඹලගෙ ඔය මහන්තත්ත කම හින්ද තමයි උඹලට කවදාවත් හරියන්නෙ නැත්තෙ... උඹල වගේ කාළකණ්නි ඉන්නකන් මේ රට කවදාවත් දියුණු වෙන්නෙ නෑ... මේ.. අපි යමු යන්න... මේකිගෙ අඹ අපිට වැඩක් නෑ...."

මෙසේ කියූ ජිනසේන පිරිස සමග බස් රථයට නැගුනි. රටේ දියුණුවට '*අති මහත් සේවාවක්* ' මනා පරිත්‍යාගයකින් සිදු කරන මේ පිරිස රැගත් බස් රථය දුම් රොටු නංවමින් පිටත්ව ගියේය.

තම දර්ශන පථයෙන් ඈත්වී යන බස් රථය දෙස සරීනා හැඟීම් බර මුහුණින් බලා සිටියාය. ඇගේ හදවතට ඇති වූ වේදනාවත්, ස්වාමි භක්තිය හා දරු සෙනෙහස නිසා ඇතිවූ ආදරයත් එකට මුසුවී ඇයට අමුතුම ශක්තියක් ඇති විය. ඇගේ දෙනෙතින් වැස්සුන උණු කඳුලු ඇය ඉදිරියේ ඇති අඹ ගෙඩි මත පතිත විය. සිය සුරතල් පුතු තුරුලු කරගත් සරීනා රිසිසේ දෑසින් උණු කඳුලු ගලන්නට ඉඩ දුන්නාය.

එහෙත් ඒ කඳුලු වල ගැබ්වී තිබුනේ ශෝකයක් නොවේ. එහි ගැබ් වී තිබුනේ ඉවසීම, නොපසුබස්නා උත්සාහය, උද්‍යෝගය හා ජීවිතය අවංකව ඉදිරියට ගෙන යාමේ දැඩි අධිෂ්ඨානයයි. කිසිම බාධකයකින් පසුබට නොවී සරීනා සිය පවුල සමග ඉදිරියට ගමන් කරනු ඇත. අන්තිම ලේ බිංදුව දක්වා ජීවිත සටනට මුහුණ දීමේ ශක්තිය ඇයට ඇත.

මහ පොළොවේ පය ගසා ජීවත් වන ජනතාව අතර රන් මිණි කැටයක් වූ සරිනා දේශයේ දිරිය දියණියකි.

*(අවසානය නොවේ. හිරු සඳු පවතින තාක් කල් ජීවිතය දුක් කම් කටොලු මැදින් ඉදිරියට යනු ඇත)*

*************

**"යුක්තිය රජයන ලොවකට අප රැගෙන යන්න... උතුමාණෙනි"**

**....ඒ අසිරිමත් දින හිරු උදාවන තුරු අපි ආශාවෙන් බලා සිටින්නෙමු....**

